ජාතික මූලික අධ්‍යයන ආයතනය

அடிப்படைக் கற்கைகளுக்கான தேசிய நிறுவகம்

NATIONAL INSTITUTE OF FUNDAMENTAL STUDIES



වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT 2017

විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය

விஞ்ஞான, தொழில்நுட்ப மற்றும் ஆராய்ச்சி அமைச்சு

Ministry of Science , Technology and Research

081 2 232 002 081 2 232 131 info@nifs.ac.lk www.nifs.ac.lk

විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය



ජාතික මූලික අධ්‍යයන ආයතනය

වාර්ෂික වාර්තාව

2017

පටුන

	පිටුව
1. හැඳින්වීම	03
2. ජාතික මූලික අධ්‍යයන ආයතනයේ පාලක මණ්ඩලය	04
3. පර්යේෂණ සභාව	05
4. විගණන සහ කළමනාකරණ කමිටුව	06
5. සංවිධාන ව්‍යුහය	07
6. අධ්‍යක්ෂ තුමාගේ වාර්තාව	08
6.1 අධ්‍යක්ෂ තුමාගේ පණිවුඩය	08
6.2 ආයතනයේ කාර්ය සාධනය	08
6.2A. සාරාංශය	08
6.2B. පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය	12
6.2C. සහයෝගිතා සහ උපදේශන අංශයේ ප්‍රගතිය	20
6.2D. විද්‍යා අධ්‍යාපනය සහා ව්‍යාප්ති ඒකකයේ ප්‍රගතිය	20
6.2E. පුස්තකාල අංශයේ ප්‍රගතිය	22
6.3 මානව සම්පත්	22
6.4. වාර්ෂික අයවැය	27
7. වාර්ෂික ගිණුම් වාර්තා	28
8. විගණන සහ කළමනාකරණ කමිටුවේ වාර්තාව	38
9. විගණකාධිපති වාර්තාව	40
10. පාලක මණ්ඩලයේ නිරීක්ෂණ	51

1. හැඳින්වීම

ජාතික මූලික අධ්‍යයන ආයතනය

1981 අංක 55 දරණ පාර්ලිමේන්තු පනත මගින් පිහිටුවන ලද මහනුවර ජාතික මූලික අධ්‍යයන ආයතනය විද්‍යාවේ සහ මානව සම්පත් හි අභිවෘද්ධිය උදෙසා මෙන්ම ජාතික සංවර්ධනය උදෙසා පාර්ලිමේන්තු පනතක් මගින් ප්‍රධාන අරමුණු ලෙස විද්‍යාවේ මූලික සිද්ධාන්ත පිළිබඳ පර්යේෂණ ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ මූලික පර්යේෂණ වල නියැලීම පිණිස පිහිටුවා ඇති ශ්‍රී ලංකාවේ එකම පර්යේෂණ ආයතනය වේ.

දැක්ම

"විද්‍යාවේ මූලික සිද්ධාන්ත පිළිබඳ පර්යේෂණ සිදුකිරීමෙහිලා විශිෂ්ටත්වය සහිත කීර්තිමත් මධ්‍යස්ථානයක් වීම"

මෙහෙවර

"ජාතික සංවර්ධනය සඳහා දායක වන ලෙස විද්‍යා දැනුම වර්ධනය සහ මානව සම්පත් සංවර්ධනය උදෙසා විද්‍යාවේ මූලික සිද්ධාන්ත පිළිබඳ උසස් මට්ටමේ පර්යේෂණ ආරම්භ කිරීම, පර්යේෂණ වල නියැලීම සහ අනුග්‍රාහකත්වය සැපයීම"

අරමුණු

- ගණිතය, භෞතික විද්‍යාව, හා රසායන විද්‍යාව, ජීව විද්‍යාව, සමාජ විද්‍යා සහ දර්ශනය යන විෂයන් පුළුල්ම අර්ථයෙන් ගෙන ඒම විෂයන් කෙරෙහි විශේෂිත අවධානයක් ඇතිව මූලික අධ්‍යයනය පිළිබඳව පර්යේෂණ ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ එම මූලික පර්යේෂණ වල නියැලීම සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සහයෝගීතාවයන් සහිතව පර්යේෂණ සඳහා අවශ්‍ය වන යෙදෙවුම් වැඩිදියුණු කිරීම.

- ආයතනයේ පර්යේෂණ කටයුතු ඉදිරියට ගෙන යනු පිණිස සහ විද්‍යා දැනුම ව්‍යාප්ත කරනු පිණිස දේශන, රැස්වීම්, සම්මන්ත්‍රණ සහ සාකච්ඡා සමුළු සංවිධානය කිරීම.

- ශ්‍රී ලංකාව ඇතුලත සහ විදේශවල නිර්මාණාත්මක කාර්යයන්හි නිරතව සිටින විද්‍යාඥයින්ට දේශන පැවැත්වීමට සහ ආයතනයේ පර්යේෂණ කටයුතු වලට සහභාගි වීමට ඇරයුම් කිරීම.

- ජාතික අරමුණු ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධන කිරීමට වගබලාගනිමින් වෙනත් රටවල විද්‍යා කටයුතු වලින් යුක්ත තැනතන් සහ විද්‍යා ආයතන සමග සබඳතා ඇතිකර ගැනීම සහ පවත්වා ගෙන යාමද ආයතනයේ අරමුණු පරමාර්ථ වලට අදාළ කරණු සම්බන්ධයෙන් අන්තර් ජාතික සහයෝගිතාව ඇති කිරීම.

- 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනත මගින් පිහිටු වන ලද විශ්ව විද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතන විසින් ප්‍රදානය කරනු ලබන පශ්චාත් උපාධි සඳහා වූ පර්යේෂණ සඳහා පුහුණු කිරීම, මාර්ගෝපදේශකත්වය සහ සහයෝගය ලබාදීම.

- ආයතනයේ අරමුණු හා පරමාර්ථ මුදුන්පත් කිරීම සඳහා අවශ්‍ය වන වෙනත් ක්‍රියා සිදුකිරීම.

2. ජාතික මූලික අධ්‍යයන ආයතනයේ පාලක මණ්ඩලය

සභාපති (අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද)
මහාචාර්ය අනුර චක්‍රමසිංහ, විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය

සාමාජිකයින්

නිලබලයෙන් පත් වූ සාමජිකයින්

- අතිගරු ජනාධිපති තුමන්ගේ විද්‍යා උපදේශක
- **මහාචාර්ය මොහාන්ද සිල්වා,** සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
- **මහාචාර්ය එස්.එච්.පී.පී. කරුණාරත්න,** අධ්‍යක්ෂ, ජාතික මූලික අධ්‍යයන ආයතනය

අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද සාමජිකයින්

- **මහාචාර්ය එම්. ඒ. කේ. එල්. දිසානායක,** පර්යේෂණ මහාචාර්ය, ජාතික මූලික අධ්‍යයන ආයතනය
- **මහාචාර්ය එන්. ජී. ජේ. ඩයස්,** පරිගණක පද්ධති ඉංජිනේරු අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය
- **ආචාර්ය ඩබ්. කේ. බී. එන්. ප්‍රේම්,** හිටපු අධ්‍යක්ෂ ජෙනරාල්, භූ විද්‍යා හා පතල් කාර්යංශය

අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමජිකයින්

- **මහාචාර්ය සී. පී. දීපාල් ඩබ්. මැතිව්,** ජෛව රසායන හා අණුක ජීව විද්‍යා අධ්‍යයන අංශය, කොළඹ විශ්ව විද්‍යාලය
- **මහාචාර්ය එම්. ජේ. එස්. විජේරත්න,** සත්ව විද්‍යා පිළිබඳ සහ පාරිසරික කළමණාකරණය පිළිබඳ ජේෂ්ඨ මහාචාර්ය, කැළණිය විශ්ව විද්‍යාලය, /සභාපති, ජාතික විද්‍යා සහ තාක්ෂණ කොමිෂන් සභාව

පර්යේෂණ සභාව විසින් නිර්දේශ කරන ලද සාමජිකයින්

- **මහාචාර්ය නාමල් ප්‍රියන්ත,** රසායන විද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය
- **මහාචාර්ය යූ. එල්. බී. ජයසිංහ,** ජේෂ්ඨ පර්යේෂණ මහාචාර්ය, ජාතික මූලික අධ්‍යයන ආයතනය

භාණ්ඩාගාරය විසින් පත් කරන ලද සාමජිකයින්

- **ජේ. එම්. යූ. පී. ජයමහ මයා**, අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල්, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය

පාලක මණ්ඩලයේ ලේකම්, ජාතික මූලික අධ්‍යයන ආයතනය

- **ආචාර්ය පී. එස්. බී. වඳුරාගල**

3. පර්යේෂණ සභා සමාජිකයින්

සභාපති

- **මහාචාර්ය එස්.එච්.පී.පී. කරුණාරත්න,** අධ්‍යක්ෂ/ජාතික මූලික අධ්‍යයන ආයතනය

සමාජිකයින්

අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනලද සාමාජිකයින්

- මහාචාර්ය ඩී. එම්. ඩී. යකන්දාවල, විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
- මහාචාර්ය රුවන් දුමින්ද ජයසිංහ, දන්ත වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

විශ්ව විද්‍යාල ප්‍රතිපදාන කොමිසන් සභාව විසිනි යෝජිත සාමාජිකයින්

- මහාචාර්ය එච්. එම් .ඩී. නාමල් ප්‍රියන්ත, විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
- මහාචාර්ය ආර්. එල්. චන්ද්‍රජීත්, විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
- මහාචාර්ය ජී. කේ .ආර්. සේනාධීර, භෞතික විද්‍යා අංශය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය
- මහාචාර්ය ඩී. කේ. වීරකෝන්, සත්ත්ව විද්‍යා අංශය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

නිලබලයෙන් පත් වූ සාමාජිකයින්

ජාතික මූලික අධ්‍යයන ආයතනයේ සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ පර්යේෂණ මහාචාර්ය, පර්යේෂණ මහාචාර්ය, ආශ්‍රිත පර්යේෂණ මහාචාර්ය, සහ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ආචාර්යවරුන්

- ජ්‍යෙෂ්ඨ පර්යේෂණ මහාචාර්ය ඒ. නානායක්කාර
- ජ්‍යෙෂ්ඨ පර්යේෂණ මහාචාර්ය ජේ. බණ්ඩාර
- ජ්‍යෙෂ්ඨ පර්යේෂණ මහාචාර්ය යූ. එල්. බී. ජයසිංහ
- ජ්‍යෙෂ්ඨ පර්යේෂණ මහාචාර්ය ජී. සෙනවිරත්න
- පර්යේෂණ මහාචාර්ය එම්. ඒ. කේ .එල්. දිසානායක
- පර්යේෂණ මහාචාර්ය ඩී. එස්. ඒ. විජේසුන්දර
- පර්යේෂණ මහාචාර්ය ජී .ආර්. ඒ. කුමාර
- ආශ්‍රිත පර්යේෂණ මහාචාර්ය එස්. පී. බෙන්ජමින්
- ආශ්‍රිත පර්යේෂණ මහාචාර්ය එම්. සී. එම්. ඉක්බාල්
- ආශ්‍රිත පර්යේෂණ මහාචාර්ය එන්. ඩී. සුබසිංහ
- ආශ්‍රිත පර්යේෂණ මහාචාර්ය ඩී. එන්. මගනආරච්චි
- ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ආචාර්ය ආර්. ආර්. රත්නායක
- ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ආචාර්ය එම්. එස්. විතානගේ

ජාතික මූලික අධ්‍යයන ආයතනයේ සේවයේ නියුතු පර්යේෂණ ආචාර්යවරුන් අතුරින් තෝරා පත්කර ගන්නා ලද සාමාජිකයින්

- පර්යේෂණ ආචාර්ය එම්. ඩබ්.එම්. ඒ. සී. විජේසිංහ
- පර්යේෂණ ආචාර්ය ආර්. ලියනගේ

ලේකම්, පර්යේෂණ සභාව

- ආචාර්ය පී. එස්. බී. වදුරාගල

4. විගණන සහ කළමනාකරණ කමිටුව

කමිටු සාමාජිකයින්

1. එම්. යූ. පී. ජයමහ මහතා (සභාපති) භාණ්ඩාගාර නියෝජන,
   අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය

2. මහාචාර්ය එන්. ජී. ජේ. ඩයස් (පාලක මණ්ඩල සාමාජික)
   පරිගණක විද්‍යා මහාචාර්ය, සංඛ්‍යාතය සහ පරිගණක විද්‍යා දෙපාර්තමේන්තුව කැළණිය විශ්ව විද්‍යාලය

3. මහාචාර්ය එම්. ජේ. එස්. විජේරත්න (පාලක මණ්ඩල සාමාජික)
   සත්ව විද්‍යා පිළිබඳ සහ පාරිසරික කළමණාකරණය පිළිබඳ ජේෂ්ඨ මහාචාර්ය, කැළණිය විශ්ව විද්‍යාලය, /සභාපති, ජාතික විද්‍යා සහ තාක්ෂණ කොමිෂන් සභාව

4. මහාචාර්ය සී.පී.දීපාල් ඩබ්.මැතිව් (පාලක මණ්ඩල සාමාජික)
   ජෛව රසායන සහ අනුක ජෛව විද්‍යා දෙපාර්තමේන්තුව, වෛද්‍ය විද්‍යා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය

ලේකම්/කැදවුම්කරු, විගණන හා කළමණාකරණ කමිටුව

5. ආචාර්ය පී. එස්. බී. වඳුරාගල (ලේකම්, පාලක මණ්ඩලය)
   ලේකම්/කැදවුම්කරු, විගණන හා කළමණාකරණ කමිටුව

නිරීක්ෂක

6. එස්. ඩබ්ලිව්. ඩී. එන්. වික්‍රමසිංහ මහතා
   විගණන අධිකාරී
   රාජ්‍ය විගණන අධිකාරී අංශය
   පේරාදෙණිය විශ්ව විද්‍යාලය

7. එම්. සී. ගමගේ මහතා
   ප්‍රධාන අභ්‍යන්තර විගණක
   විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

8. මහාචාර්ය එස්. එච්. පී. පී. කරුණාරත්න (පාලක මණ්ඩල සාමාජික)
   අධ්‍යක්ෂ, (ප්‍රධාන විධායක නිලධාරී/ප්‍රධාන මූල්‍ය නිලධාරී)
   ජාතික මූලික අධ්‍යයන ආයතනය

9. පී. එස්. එස්. සමරක්කොඩි මිය
   ගණකාධිකාරී
   ජාතික මූලික අධ්‍යයන ආයතනය

දායක

10. එස් .එන්. ජයසූරිය මිය,
    ඉන්දික විජේසිංහ මයා,
    අභ්‍යන්තර විගණන නිලධාරීන්
    ජාතික මූලික අධ්‍යයන ආයතනය

5. ජාතික මූලික අධ්‍යයන ආයතනයේ සංවිධාන ව්‍යුහය



6.අධ්‍යක්ෂ තුමාගේ වාර්තාව

6.1 අධ්‍යක්ෂ තුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකා ජාතික මූලික අධ්‍යයන ආයතනයෙහි 2017 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව එළි දැක්වීමේ අවස්ථාව සනිටුහන් කරනු වස් මෙකී පණිවුඩය ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණකි. ජාතික සංවර්ධනය උදෙසා මූලික විද්‍යා විෂය සීමාවන්හි පර්යේෂණ මෙහෙයවීම සහ ව්‍යාප්ත කිරීමේ අරමුණින් යුතුව ස්ථාපිත කරනු ලැබූ ජාතික මූලික අධ්‍යයන ආයතනය ශ්‍රී ලංකාවේ අද්විතීය සංවිධානයකි. විද්‍යා දැනුමෙහි අභිවෘද්ධිය පිණිස ජාතික මූලික අධ්‍යයන ආයතනයෙහි විද්‍යාඥයන් විසින් සිදු කරන ලද සුවිශේෂී දායකත්වයන්ගෙන් සමහරක් මෙම විශේෂ අවස්ථාවේදි එළිදක්වනු ලැබේ. මෙහිදී අප විසින් පර්යේෂණ ඒකක 6ක් යටතේ විවිධ තේමානුගත පර්යේෂණ ක්ෂේත්‍ර 16ක් ඉලක්ක ගත කර ඇත.

මෙම අසිරු ඉලක්කය සපුරා ගැනීම පිණිස ව්‍යාපෘති නායකයන් 16 දෙනෙකුගේද තරුණ විද්‍යාඥයන් බොහෝ පිරිසකගේද දැඩි කැපවීම ඉවහල් විය. ඉහත ව්‍යාපෘති ඉලක්ක 6 වනුයේ, ශක්තිය හා උසස් පදාර්ථ, සෛද්ධාන්තික භෞතික විද්‍යාව සහ සංඛ්‍යාත්මක අධ්‍යනය, ස්වාභාවික නිෂ්පාදනය සහ ආහාර රසායන විද්‍යාව, ක්ෂුද්‍ර ජීව විද්‍යාව සහ කාබන් තිරකරණය, භූගෝල පරිසරය සහ ජෛව විවිධත්වය සහ අනුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණයයි.

මෙම පර්යේෂණ වැඩසටහන් ජාතික, ප්‍රාදේශීය සහ ජාත්‍යන්තර විද්‍යාත්මක කණ්ඩායම් සමඟ සක්‍රීයව සහ සහයෝගීත්වයෙන් යුක්තව ක්‍රියාත්මක කෙරුනු අතර ජාතික මූලික අධ්‍යයන ආයතනයේ විද්‍යාඥයන් සිය පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය අරමුදල් තරඟකාරීවද සාර්ථකවද ජාතික හා ජාත්‍යන්තර අරමුදල් සපයන්නන්ගෙන් ලබා ගැනීමට තරම් දක්ෂ වූහ. 2017 වර්ෂයේදී, පරිසර විද්‍යාව, ආහාර විද්‍යාව, සහ පෝෂණ සහ Bioinformatics යන පර්යේෂණ ව්‍යාපෘති වල නියැලීම පිණිස ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන් පස් දෙනෙකු පත් කිරීමට ජාතික මූලික අධ්‍යයන ආයතනයට හැකිවිය.

අපි ජාතික සංවර්ධනය උදෙසා ක්‍රියා කරනු ලබන සංවිධාන සමඟද සහයෝගි වැඩසටහන් ආරම්භ කර සිටිමු. රටෙහි පවතින ප්‍රධාන පශ්චාත් උපාධි පර්යේෂණ ආයතනයක් ලෙස ජාතික මූලික අධ්‍යයන ආයතනය හඳුනාගෙන ඇති අතර වර්තමානයේ පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන් 80කට අධික සංඛ්‍යාවක් සිය පශ්චාත් උපාධි පාඨමාලා සඳහා අප ආයතනයෙහි විද්‍යාත්මක පර්යේෂණවල නියැලමින් සිටී. මීට අමතරව ජාතික මූලික අධ්‍යයන ආයතනය විද්‍යා අධ්‍යාපන සහ ජාතික මූලික අධ්‍යයන ආයතනයෙහි ව්‍යාප්ත ඒකකය හරහා විද්‍යා අධ්‍යාපන ක්‍රියාකාරකම් මෙන්ම සුවිශේෂී පර්යේෂණ සොයාගැනීම් ව්‍යාප්ත කිරීම සඳහාද වේදිකාවක් සපයනු ලැබේ.

මහාචාර්ය ලලිත් ජයසිංහ
වැ.බ. අධ්‍යක්ෂ/ජාතික මූලික අධ්‍යයන ආයතනය

6.2 ආයතනයේ කාර්යසාධනය

6.2A සාරාංශය

ජාතික මූලික අධ්‍යයන ආයතනය තම ආයතනය සතු සීමිත සම්පත් උපයෝගී කර ගනිමින් ඉලක්ක සපුරාගැනීමට සමත්වී ඇත. 2017 වර්ශයේ ආයතනයේ ප්‍රගතිය ඉතා සතුටුදායක වන අතර සිදුකරන ලද පර්යේෂණ විද්‍යාවේ අභිවෘධිය උදෙසා විශාල දායකත්වයක් ලබා දී ඇති අතර සමස්ථයක් ලෙස රටේ සංවර්ධනය උදෙසා දායක වී ඇත.

2017 වර්ෂයේදී පමණක් ජාතික මූලික අධ්‍යයන ආයතනයේ විද්‍යාඥයින් පර්යේෂණ පත්‍රිකා 77ක් පර්යේෂණ සහරා වල පළකර ඇති අතර ඒවා අතරින් පර්යේෂණ පත්‍රිකා 52ක් විද්‍යා උපහැණ අනුක්‍රමනිකාව හා විස්තාරිත විද්‍යා උපහැණ අනුක්‍රමනිකාව තුල නිර්දේශිත සහරා තුල පලවී ඇති අතර පර්යේෂණ සම්මන්ත්‍රණ සාරාංශ 123 ක් ප්‍රකාශයට පත්කර ඇත.

ප්‍රකාශණ වර්ගය	ප්‍රකාශණ ගණන
විද්‍යා උපහැණ අනුක්‍රමනිකාව තුල නිර්දේශිත සඟරා	28
විස්තාරිත විද්‍යා උපහැණ අනුක්‍රමනිකාව තුල නිර්දේශිත සඟරා	24
පර්යේෂණ සඟරා	25
පර්යේෂණ සම්මන්ත්‍රණ සාරාංශ	123
පොත් පරිච්ඡේද	10
පුවත්පත් ලිපි	33

6.2A.2. සම්මාන සහ පිළිගැනීම්

2017 වර්ෂයේ දී ජාතික සංවර්ධනය සහ විද්‍යාවේ අභිවෘද්ධිය උදෙසා ජාතික මූලික අධ්‍යයන ආයතනයේ විද්‍යාඥයින්ගේ මහගු දායකත්වය අගයමින් ඔවුන් විවිධ දේශීය සහ ජාත්‍යන්තර මට්ටමේ සම්මාන වලින් පිදුම් ලබා ඇත.

a) **ජාත්‍යන්තර සම්මාන සහ පිළිගැනීම්**

- Chairman of the Organizing Committee Solar Asia -2018 International Research Conference *(From April 2017)*
  Prof. M.A.K.L. Dissanayake
- Reviewer for Journal of Power Sources, Elsevier
  Prof. M.A.K.L. Dissanayake
- Reviewer for Optik International Journal for Light and Electron Optics
  Prof. M.A.K.L. Dissanayake
- Visited China as a member of the Ministerial Delegation to initiate collaborative research on solar cells and facilitate R&D
  Prof. M.A.K.L. Dissanayake
- CAS president's international fellowship initiative (pifi) award from Chinese Academy of science
  Prof. J. Bandara
- The associate Editor, Agriculture, Ecosystems & Environment, Elsevier
  Prof. G. Seneviratne
- Member of the International Advisory Board of ACS College of Engineering, India
  Prof. D. Subasinghe
- The Best Graduate Scientist, from American Geophysical Union, Dr. M. Vithanage
- Supported 5 International documentary films from BBC - Prof. W. Dittus
- Delivered the keynote address on “Historic perspectives and challenges ahead” at University of Sargodha, Panjab, Pakistan
  Prof. S.H.P.P. Karunaratne
- Delivered a plenary lecture on “Insecticide Resistance in Insects” at GC University, Lahore, Pakistan
  Prof. S.H.P.P. Karunaratne
- Member of the DDT Expert Group, UNEP/ WHO, Geneva, Switzerland
  Prof S.H.P.P Karunaratne
- Member of the Editorial Board, International Journal of Entomological Research
  Prof S.H.P.P Karunaratne
- Competitive Erasmus Mundas – Glink Fellowship to undertake collaborative research at the West of Scotland University, UK from European Commission
  Mr. M.M. Qader

b) ජාතික සම්මාන සහ පිළිගැනීම්

- 2015 විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන (2017 වර්ෂයේදී ප්‍රදානය කරන ලදී)
  මහාචාර්ය එම්.ඒ.කේ.එල්. දිසානායක
  මහාචාර්ය ජේ.එම්.එස්. බණ්ඩාර
  මහාචාර්ය ජී.ආර්.ඒ. කුමාර
  මහාචාර්ය එල්. ජයසිංහ
  මහාචාර්ය එන්.එස්. කුමාර්
  මහාචාර්ය ඩී. සුභසිංහ
  ආචාර්ය එම්. විතානගේ
  ආචාර්ය එල්.පී. ජයරත්න
  මහාචාර්ය එම්.සී.එම්. ඉක්බාල්

- 2015 විද්‍යාත්මක ප්‍රකාශන සඳහා කුසලතා සම්මානය(2017 වර්ෂයේදී ප්‍රදානය කරන ලදී)
  මහාචාර්ය එම්.ඒ.කේ.එල්. දිසානායක
  මහාචාර්ය ජී. සෙනවිරත්න
  ආචාර්ය රුවිනි ලියනගේ

- MPhil උපාධි අධීක්ෂණය සඳහා SUSRED සම්මාන (ජාතික විද්‍යා පදනම)
  ආචාර්ය එල්.පී. ජයරත්න
  මහාචාර්ය ජී.ආර්.ඒ. කුමාර

- විද්‍යාත්මක ප්‍රකාශන සඳහා NRC කුසලතා සම්මාන
  මහාචාර්ය එස්. පී. බෙන්ජමින්

- විද්‍යා ප්‍රචලිත කිරීම සඳහා වූ සම්මානය (ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය සහ ජාතික විද්‍යා පදනම)
  ආචාර්ය එම්. විතානගේ

- රසායන විද්‍යාව සඳහා TWAS-NSF සම්මානය
  ආචාර්ය එම්. විතානගේ

- අති විශිෂ්ට පූර්ණ සේවා ප්‍රසාධනී 2017, සේවා අති විශිෂ්ඨ සම්මානය, වන ජීවී සහ තිරසාර සංවර්ධන අමාත්‍යාංශය
  මහාචාර්ය ඩී. එස්. ඒ. විජේසුන්දර

- ව්‍යාභාරික විද්‍යාව සඳහා කන්දයියා අනුස්මරණ සම්මානය, ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනය - 46 වන සැසි වාරය
  සී.එල්.කෙහෙල්පන්නල මිය

- මූලික විද්‍යාව සඳහා කන්දයියා අනුස්මරණ රන් සම්මානය, ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනය - 46 වන වාර්ෂික සැසිය එම්. එම්. ක්වාඩර් මයා

- ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ බණිජ විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණයෙහි විශිෂ්ට වාචික ඉදිරිපත් කරන්නා
  එස්. පයින්තමිල් මිය

- විශිෂ්ට වාචික ඉදිරිපත් කරන්නාහි තුන්වන ස්ථානය ශ්‍රී ලංකාවේ බණිජ සම්පත් පිළිබඳ පර්යේෂණ සම්මන්ත්‍රණය

  එච්. පී. ටී. එස්. හේවාතිලක මයා

- ජාතික මූලික අධ්‍යයන ආයතනයේ විශිෂ්ඨ විද්‍යාඥයා - දෙවන ස්ථානය
  මහාචාර්ය එම්. ඒ. කේ. එල්. දිසානායක

- සභාපති, ශ්‍රී ලංකා භූ විද්‍යා සංගමය
  මහාචාර්ය ඩී. සුභසිංහ

- සභාපති, තරුණ විද්‍යාඥ සංගමය, ජාතික විද්‍යා සහ තාක්ෂණික කොමිසම
  ආචාර්ය එම්. විතානගේ

- Editor – in- chief, Ceylon journal of science Peradeniya, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
  මහාචාර්ය එම්. ඒ. කේ. එල්. දිසානායක

- කමිටුවෙහි සාමාජික, විද්‍යාව සහ තාක්ෂණය ප්‍රතිපත්ති පර්යේෂණය පිළිබඳ (ජාතික විද්‍යා පදනම)
  මහාචාර්ය එම්. ඒ. කේ. එල්. දිසානායක

- මූලික විද්‍යාත්මක පර්යේෂණ ප්‍රදාන යෝජනා, ජාතික විද්‍යා පදනම
  මහාචාර්ය එම්. ඒ. කේ. එල්. දිසානායක

- 2016-2017 NRC පර්යේෂණ ප්‍රදාන සඳහා ඇගයුම්කරු
  මහාචාර්ය එම්. ඒ. කේ. එල්. දිසානායක

- මූලික විද්‍යාත්මක පර්යේෂණ ප්‍රතිපත්ති පිළිබඳ අධ්‍යයන කණ්ඩායම් සාමාජික NASTEC
  මහාචාර්ය එම්. ඒ. කේ. එල්. දිසානායක

- උප සභාපති 3 කාණ්ඩය, ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය
  ආචාර්ය එම්. විතානගේ

- ශාක පර්යටනය පිළිබඳ ආරාධිත දේශණය BMICH හිදී, ශ්‍රී ලංකා වන ජීවී සහ ස්වභාව ධර්ම ආරක්ෂණ සංවිධාන (WNPS)
  මහාචාර්ය ඩී.එස්.ඒ. විජේසුන්දර

- සම සභාපති, ජාතික ආක්‍රමණශීලී විශේෂ විශේෂඥ කණ්ඩායම, මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය
  මහාචාර්ය ඩී .එස්. ඒ .විජේසුන්දර

- 3වන ජාතික ජෛව විවිධත්ව ප්‍රවීණ කමිටු සාමාජික, මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය-
  මහාචාර්ය ඩී. එස්. ඒ. විජේසුන්දර

- ජාතික විශේෂ සංරක්ෂණ උපදේශක කණ්ඩායම් සාමාජික, මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය
  මහාචාර්ය ඩී.එස්.ඒ. විජේසුන්දර

- දේශගුණික වෙනස්වීම් අනුවර්තනය පිළිබඳ ජාතික ප්‍රවීණ කමිටු සාමාජික, මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය
  මහාචාර්ය ඩී.එස්.ඒ. විජේසුන්දර

- කඩොලාන සංරක්ෂණ සහ තිරසර භාවිතය පිළිබඳ ජාතික ප්‍රවීණ කමිටු සාමාජික, මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය
  මහාචාර්ය ඩී.එස්.ඒ. විජේසුන්දර

- මූලික විද්‍යා පර්යේෂණ ප්‍රතිපත්ති NASTEC - අධ්‍යයන කණ්ඩායම් සාමාජික
  මහාචාර්ය ඩී.එස්.ඒ. විජේසුන්දර

- ප්‍රවීන කමිටු සාමාජික, ලෝක බැංකු ආධාර ලද පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමණාකරණ ව්‍යාපෘතිය (ESCAMP)
  මහාචාර්ය ඩී.එස්.ඒ. විජේසුන්දර

- ජෛව විවිධත්ව සහ පරිසරය පිළිබඳ ජාතික කමිටු සාමාජික, ජාතික විද්‍යා පදනම
  මහාචාර්ය ඩී.එස්.ඒ. විජේසුන්දර

- මිනිසා සහ ජෛව ගෝලය පිළිබඳ ජාතික කමිටු සාමාජික, ජාතික විද්‍යා පදනම
  මහාචාර්ය ඩී.එස්.ඒ. විජේසුන්දර

- REDD + අධ්‍යයන සහ පර්යේෂණ සංසඳ සාමාජික, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
  මහාචාර්ය ඩී.එස්.ඒ. විජේසුන්දර

- Wild Lanka සහරාවෙහි කතෘ මණ්ඩල සාමාජික, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
  මහාචාර්ය ඩී. එස් .ඒ. විජේසුන්දර

- Rheeda කතෘ උපදේශක මණ්ඩල සාමාජික, විවෘත බීජක වර්ගීකරණය සඳහා ඉන්දියානු සංගමය
  මහාචාර්ය ඩී. එස්. ඒ.විජේසුන්දර

- Journal of Primatology හී සහකාර සංස්කාරක
  මහාචාර්ය ඩබ්. ඩිටස්

- උපදේශක කමිටු සහ මෙහෙයුම් කමිටු සාමාජික, Sri Lanka institute of Biotechnology & Biotechnology Innovation park
  මහාචාර්ය ඩී. එන්. මගනආරච්චි

- කමිටු සාමාජික A member of the panel for Evaluation of Presentations at Sixth YSF Symposium, ජාතික විද්‍යා සහ තාක්ෂණික කොමිෂම
  මහාචාර්ය ඩී. එන්. මගනආරච්චි

- An observer for Laboratory Accrebitation at Indrusrial Technology Institute (ITI), Sri Lanka Accreditation Board(SLAB)
  මහාචාර්ය ඩී. එන්. මගනආරච්චි

- මූලික විද්‍යාව පිළිබඳ ක්‍රියාකාරී කමිටු සාමාජික (ජාතික විද්‍යා පදනම)
  මහාචාර්ය එස්. එච්. පී .පී. කරුණාරත්න

- මූලික විද්‍යා පර්යේෂණ ප්‍රතිපත්ති පිළිබඳ අධ්‍යයන කණ්ඩායම් සාමාජික, ජාතික විද්‍යා සභ තාක්ෂණික කොමිෂම
  මහාචාර්ය එස්. එච්. පී .පී. කරුණාරත්න

- ශ්‍රී ලංකා සමෝධාන රෝග වාහක කළමනාකරණ තාක්ෂණ කමිටු සාමාජික, සෞඛ්‍ය අමාත්‍යාංශය
  මහාචාර්ය එස්. එච්. පී .පී. කරුණාරත්න

- සමෝධාන මදුරු මර්ධන පාලන වැඩසටහනෙහි සාමාජික, මධ්‍යම පරිසර අධිකාරිය
  මහාචාර්ය එස්. එච්. පී .පී. කරුණාරත්න

6.2B. පර්යේෂණවල ප්‍රගතිය

6.2B.1. පර්යේෂණ ව්‍යාපෘතිය **ඝන අවස්ථා භෞතික විද්‍යාව සහ ඝන අවස්ථා රසායන විද්‍යාව**
ව්‍යාපෘති නායක **මහාචාර්ය එම්. එල්. කේ. එල්. දිසානායක**

<u>පර්යේෂණ ව්‍යාපෘතියෙහි හැඳින්වීම</u>

ඝන අවස්ථා භෞතික විද්‍යාව සහ ඝන අවස්ථා රසායන විද්‍යාව ව්‍යාපෘති මඟින් ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය සතු ඉතා වැදගත් තාක්ෂණික ගුණ සූර්ය කෝෂ සඳහාද නැවත ආරෝපනය කල හැකි බැටරි සඳහාද විද්‍යුත් ප්‍රකාශ පුවරු සඳහාද නව පොලිමර් විද්‍යුත් විච්ඡේද සංස්ලේෂණය කිරීම සහ ඒවායේ ගුණාංග විදහා දැක්වීම සිදුකරනු ලබයි.

<u>වර්ෂය තුල සිදු කරනු ලැබූ පර්යේෂණ කටයුතු</u>

2017 වර්ෂයේදි විද්‍යාත්මකව සිත්ගන්නා සුළු වූද තාක්ෂණික වශයෙන් වැදගත් වූද උප ව්‍යාපෘති ගණනාවක් ඝන අවස්ථා භෞතික විද්‍යාව සහ ඝන අවස්ථා රසායන විද්‍යා ව්‍යාපෘති මඟින් සිදු කෙරිණි.

මේවා අතුරින් ප්‍රධාන වනුයේ,

(a) ද්වි සංස්ලේෂක සූර්ය කෝෂවල වැඩිදියුණු කරන ලද ප්‍රකාශ වෝල්ටීය කාර්යඵලය සඳහා නයිට්‍රජන් ආලේපන TiO_2පාදක නව බහු ස්ථරීය ඉලෙක්ට්‍රෝඩය

(b) ත්‍රිත්ව ස්ථර TiO_2 ප්‍රකාශ ඇනෝඩය සහිත PbS :Hg ක්වොන්ටම් dot-sensitized, අධි කාර්යක්ෂම සූර්ය කෝෂ ආකෘති.

(c) නැනෝ ව්‍යූහාත්මක නවීකරණය කරන ලද ත්‍රිත්ව ස්ථර TiO_2 ප්‍රකාශ ඇනෝඩය භාවිතයෙන් ද්‍රව්‍ය සතු ඉතා වැදගත් තාක්ෂණික ගුණ සූර්ය කෝෂවල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.

(d) ද්‍රව්‍ය සතු ඉතා වැදගත් තාක්ෂණික ගුණ සූර්ය කෝෂ සඳහා සහ බහු අවයවික නැනෝ තන්තු පාදක ජෙල විද්‍යුත් විච්ඡේදක.

(e) නැවත ආරෝපනය කල හැකි මැග්නීසියම් බැටරි සඳහා Mg^+ අයන වාහක බහු අවයවක විද්‍යුත් විච්ඡේදක නිපදවීම.

(f) පානීය ජලයෙහි ආසනික් ඉවත් කිරීම සඳහා අඩු වියදම් බහු අවයවක ‘‘නැනෝ තන්තු පාදක ජල පෙරණ සැකසීම ආදියයි.

<u>රටෙහි පවතින කාලීන ගැටළු සඳහා වැඩිදියුණු කරන ලද විසඳුම්</u>

නව මිශ්‍ර කැටායන විද්‍යුත් විච්ඡේදක භාවිතයෙන් අඩු වියදම්, උසස් කාර්යක්ෂමතාවයෙන් යුතු ද්‍රව්‍ය සතු ඉතා වැදගත් තාක්ෂණ ගුණ සූර්ය කෝෂ සහ නවීකරණය කරන ලද TiO_2 ත්‍රිත්ව ස්ථරීය ප්‍රකාශ ඇනෝඩ පිරිසැකසීම, පානීය ජලයෙහි වෙසෙන රෝග කාරක බැක්ටීරියා ඉවත් කිරීම පිණිස අඩු වියදම්, බහු අවයවක නැනෝ තන්තු ජල පෙරණ නිෂ්පාදන.

6.2B.2. පර්යේෂණ ව්‍යාපෘතිය **නැනෝ තාක්ෂණය සහ උසස් ද්‍රව්‍ය**
ව්‍යාපෘති නායක **ආචාර්ය ඒ. විජේසිංහ**

<u>පර්යේෂණ ව්‍යාපෘතිය හැඳින්වීම</u>

නැනෝ තාක්ෂණය සහ උසස් ද්‍රව්‍ය යනු කාලීන තාක්ෂණික උන්නතිය සඳහා නව මාදිලියේ අධි ලාභදායි, අධි තාක්ෂණික කාර්මික යෙදවුම් නිර්මාණය කිරීම සඳහා මූලික වශයෙන් නැගී එමින් පවතින ක්ෂේත්‍ර දෙකකි. මෙම යෙදවුම් බහුල වශයෙන් ද්‍රව්‍ය සම්පත් මත රඳා පවතින අතර විශේෂයෙන්ම ස්වාභාවික සම්පත් වැඩි දියුණු කිරීමෙන් උපයා ගත හැකිය. ශ්‍රී ලංකාවෙහි විවිධත්වයෙන් යුතු, තාක්ෂණික වටිනාකම් සහිත ඛනිජ ද්‍රව්‍ය පවතින අතර මෙම ඛනිජ මෙකී අධි තාක්ෂණික යෙදවුම් සඳහා සුවිශාල කාර්යභාරයක් ඉටු කිරීම පිණිස යොදා ගත හැකිය. කෙසේ වුවද අපගේ ඛණිජ සම්පත් වලට ඉහල එකතු කල අගයක් ලබා දීම සඳහා සිදු කරනු ලබන විද්‍යාත්මක පර්යේෂණ වල හිඟකම හේතුවෙන් මෙකී යෙදවුම් සඳහා බොහෝ දුරට රට තුල සුදුසු වැඩිදියුණු කිරීම් සිදු නොවේ.

වර්ෂය තුල සිදු කරන ලද ක්‍රියාකාරකම්

අඩු වියදම් සහ නැනෝ ද්‍රව්‍ය සංස්ලේෂණ ක්‍රමවේද භාවිතා කිරීමෙන් ශක්ති සංරක්ෂණය සඳහා අඩු වියදම් සහ කාර්යඵල නගාසිටුවීමේ උසස් ද්‍රව්‍ය සංවර්ධනය කිරීම.

- උසස් සංක්‍රමණ ලෝහ ඔක්සයිඩ අර්ධ සන්නායකවල Dopents බලපෑම සම්බන්ධව විමර්ශනය කිරීම.
- නැවත ආරෝපනය කළ හැකි Li-ion කෝෂ සඳහා ශ්‍රී ලංකා මිනිරන් ඉලෙක්ට්‍රෝඩ තවදුරටත් වැඩිදියුණු කිරීම.
- Li-ion නැවත ආරෝපනය කළ හැකි බැටරි සම්බන්ධව විද්‍යුත් රසායනික ක්‍රියාකාරිත්වයන් විමර්ශණය කිරීම.
- නුදුරු අනාගතයේ භාවිතයට පැමිණීමට නියමිත Na-ion සහ Mg-ion කෝෂවල විද්‍යුත් විච්ඡේදක සහ ඉලෙක්ට්‍රෝඩ සඳහා ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
- උසස්/අධි තාක්ෂණික/ නැනෝ තාක්ෂණික යෙදවුම් සඳහා ශ්‍රී ලංකාවේ ඛණිජ සහ අදාල ද්‍රව්‍ය සඳහා එකතුකල අගයක් ලබා දීම.
- ශ්‍රී ලාංකීය ඉල්ලම් මිනිරන් පිළිබඳ ව්‍යුහාත්මක නවීකරණය සහ යකඩ අන්තර් ප්‍රවේශන විමර්ශනය
- ශ්‍රී ලාංකීය මිනිරන් වලින් ග්‍රැෆේන්, කාබන් , නැනෝ සංයුක්ත සහ වෙනත් නැනෝ භාවයන් සකස් කිරීම.
- කාර්යක්ෂම ජල පවිත්‍රකරණය සඳහා විභවය සහිත ශ්‍රී ලාංකීය ඛණිජ ගවේෂණය සහ දෘඩතාවය අඩු කිරීම සඳහා අඩු වියදම් කාර්යක්ෂම සිරස් ජල පෙරණ සැලසුම් කිරීම.
- උසස් ද්‍රව්‍ය යෙදවීම් සඳහා ස්වාභාවික තිරුවාන (quarts) වල ගුණාත්මක වැඩිදියුණු කිරීම් විමර්ශණය කිරීම.

6.2B.3. පර්යේෂණ ව්‍යාපෘතිය **ශක්තිය සහ උසස් ද්‍රව්‍ය රසායනවිද්‍යාව**
ව්‍යාපෘති නායක **මහාචාර්ය ජේ. බණ්ඩාර**

පර්යේෂණ ව්‍යාපෘතිය හැඳින්වීම

පුනර්ජනනීය බලශක්තින් සඳහා පර්යේෂණයන් සිදු කිරීම බලශක්ති හා උසස් තාක්ෂණ රසායන විද්‍යා ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වේ. සූර්ය ශක්තිය, රසායනික හා විද්‍යුත් ශක්තිය බවට පරිවර්තනය කිරීමෙහි ලා ඇවැසි නව්‍ය ද්‍රව්‍ය වැඩි දියුණු කිරීම මෙහි මූලික අරමුණ වන්නේය.

පසුගිය වසරේ සිදු කරන ලද ක්‍රියාකාරකම්

එවැනි වත්මන් පර්යේෂණ ව්‍යාපෘති කිහිපයක් නම්; ෆොටෝවෝල්ටික් හෙවත් සූර්ය විකිරණ වෝල්ටීය තාක්ෂණය ප්‍රධාන වශයෙන් Q-dot පදනම් කරගත් වර්ණ- සංවේදී සූර්ය කෝෂ සහ පොලිමර් සූර්ය කෝෂ පුළුල් කිරීම හා අනුහුරු කිරීම තුලින් සූර්ය විකිරණ වලින් සෘජුවම විදුලිය නිපදවීම, ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය එක්රැස්කර ගැනීම සඳහා කෘතිම රසායනික මෙවලම් නිපදවීම ජල අණු බිඳ දැමීමට සූර්ය විකිරණ යොදා ගැනීම, වායුගෝලීය කාබන් ඩයොක්සයිඩ් විවිධ පරිසර හිතකාමී ඉන්ධන වර්ගයන්ට පරිවර්තනය කිරීම, ව්‍යාපෘතියේ ප්‍රධාන පර්යේෂණ කර්තවයන් වනුයේ වාතය හා ජලය පිරිසිදු කිරීම සඳහා විද්‍යුත් රසායනික හා ප්‍රකාශ රසායනික ක්‍රමයන් යොදාගැනීමයි.

මීට අමතරව, ව්‍යාපෘතිය මඟින් හිරු එළිය භාවිතයෙන් කර්මාන්ත දූෂණය අවම කිරීම සඳහා අඩු වියදම් ජලය හා වාතය පිරිපහදු ක්‍රම පිළිබඳ අධ්‍යයනය කිරීමද සිදුකෙරේ.

රටෙහි පවතින කාලීන ගැටළු සඳහා වැඩිදියුණු කරන ලද විසඳුම්

දූෂ්‍ය තෙල්/ජල මිශ්‍රණ එලදායි ලෙස වෙන් කිරීම පිණිස නවීන ජල නිමග්න (superoleophobic) පටල ලෙස මයිකා ආලේපිත මළ නොබැඳෙන වානේ දැල සාර්ථකව පරීක්ෂාවට ලක් කර ඇත. මෙකී නිර්මාණ සේවා ස්ථාන වල ක්‍රියාත්මක කිරීම සඳහා NFC තාක්ෂණික ආධාර (රු.මිලියන 8.5) ලැබී ඇත.

6.2B.4. පර්යේෂණ ව්‍යාපෘතිය **ද්‍රව්‍ය පිරිසැකසුම්කරණය සහ උපකරණ සැකසීම**
ව්‍යාපෘති නායක **මහාචාර්ය ජී.ආර්.ඒ. කුමාර**

පර්යේෂණ ව්‍යාපෘතියෙහි හැඳින්වීම

මෙම ව්‍යාපෘතිය මඟින් ද්‍රව්‍ය පිරිසැකසුම්කරණය සහ උපකරණ සැකසීම පිළිබඳ පර්යේෂණ හා මූලික අධ්‍යන සිදු කරනු ලබන අතර එමඟින් ප්‍රධාන වශයෙන් දේශීය ඛණිජ භාවිතයෙන් නිෂ්පාදිත නව ද්‍රව්‍ය පදනම් කරගත් මිනිරන්, මිනිරන් පාදක වූ උපකරණ, කාබන් සුපිරි ධාරිත්‍රක සහ සූර්ය කෝෂ සහ වෙනත් ඉලෙක්ට්‍රෝනික උපකරණ හා සම්බන්ධ විමර්ෂණ කටයුතු සිදු කෙරේ.

වර්ෂය තුල සිදු කරනු ලැබූ පර්යේෂණ කටයුතු

මෙම පර්යේෂණ ව්‍යාපෘතිය මගින් අමු මිනිරන් ඛනිජය අගය එතතුකල නිෂ්පාදන බවට පරිවර්තනය කිරීම එනම් ප්‍රසාරිත මිනිරන්, ග්‍රැෆේන් ඔක්සයිඩ, සහ ග්‍රැෆේන් පුළුල් පරාසයක යෙදවීම, විශේෂයෙන් ද්‍රව්‍ය සතු ඉතා

වැදගත් තාක්ෂණික ගුණ සූර්ය කෝෂ සහ Perovskits සූර්ය කෝෂවල ප්‍රති ඉලෙක්ට්‍රෝඩ නිර්මාණය ආදී කටයුතු සිදු කෙරේ.

ව්‍යාපෘතිය හා සබැඳි තවත් ක්ෂේත්‍රයක් වනුයේ සූර්ය කෝෂවල සුපිරි ධාරිත්‍රක සහ ප්‍රති ඉලෙක්ට්‍රෝඩ සඳහා ඉහල සවිචරතාවයකින් යුතු වූද ඉහල සන්නායකතාවයකින් යුතු වූද සක්‍රීය කරන ලද අඟුරු , පොල් කටු භාවිතයෙන් නිෂ්පාදනය කිරීමය.

නව්‍ය සහ අඩු පිරිවැයකින් යුතු ක්‍රමවේදයක් භාවිත කරමින් සක්‍රිය කරන ලද අඟුරු පාදක කරගනිමින් සුපිරි ධාරිත්‍රකද අප විසින් නිර්මාණය කර ඇත. පර්යේෂණ මට්ටමේ පවතින මෙම සුපිරි ධාරිත්‍රක වැඩි දියුණු කළ පසු වර්තමානයේ වෙළඳපොලේ පවතින ධාරිත්‍රක වර්ගවල ක්‍රියාකාරිත්වය අභිබවා යනු ඇත.

දේශීය අමු මිනිරන්, ප්‍රසාරිත මිනිරන් සහ ග්‍රැෆේන් නිෂ්පාදන බවට පරිවර්තනය කිරීමේ අපගේ ව්‍යාපෘතිය හරහා 2017 වර්ෂය තුලදී සුවිශේෂ ප්‍රතිඵල අත්පත් කර ගැනීමට එනම් නව නිපයුම් කිහිපයක් හඳුන්වා දීමට ද හැකි වී ඇත. අප විසින් පතල්වල ලෝහ පසෙහි ගල් වලට බැඳුනු මිනිරන් Delaminate කිරීම සඳහා නව ක්‍රමවේදයක් නිරිමාණය කර ඇති අතර එමගින් ඉවතලන ලෝහ පසෙන් මිනිරන් නැවත වෙන්කරගත හැකිය. ඉතා ඉහල තාප සන්නායකයක් සහ විද්‍යුත් සන්නායකයක්ද වන ග්‍රැෆේන් මෙම ක්‍රමවේදය භාවිතයෙන් විශාල වශයෙන් නිෂ්පාදනය කිරීම ශ්‍රී ලංකාවේ ඇති සීමිත මිනිරන් සම්පත සඳහා එකතුකල අගයක් ලබා දීම පිණිස වඩාත් වැදගත් වනු ඇත.

6.2B.5. පර්යේෂණ ව්‍යාපෘතිය **ක්වොන්ටම් භෞතිකය**
ව්‍යාපෘති නායක **මහාචාර්ය ආසිරි නානායක්කාර**

<u>පර්යේෂණ ව්‍යාපෘතිය හැදින්වීම</u>
ක්වොන්ටම් අසමානතා (quantum non-locality), තරංග ශ්‍රිතයෙහි කඩාවැටීම් (Wave function collapse) හා කොවොන්ටම් සිට ප්‍රතිෂිත දක්වා සංක්‍රාන්තියට (quantum to classical transition) හේතු වන භෞතික යාන්ත්‍රණ පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීම.

<u>පසුගිය වසරේ සිදු කරන ලද ක්‍රියාකාරකම්</u>
කොවොන්ටම් හා ප්‍රතිෂිත (classical) අතර සහසම්බන්ධතා හා ක්වොන්ටම් අහඹු ඇවිදීම්වල *(quantum random walks)* ආවර්තිත ස්වභාවය පිළිබඳව 2017 වසරේ අප විසින් පර්යේෂණ කිහිපයක් සිදු කෙරිණි. පළමු අධ්‍යයනයේදී ප්‍රතිෂිත තත්ව නියෝජනය කරන ක්වොන්ටම් කාසි විශේෂයක් හඳුන්වා දීම මගින් ප්‍රතිෂිත ඇවිදීම් ඊට අනුරූපව ක්වොන්ටම් ඇවිදීම් හි සහසම්බන්ධතා ලෙස විද්‍යාමාන වන ආකාරය අප විමර්ශනය කළෙමු. මෙහිදී ප්‍රතිෂිත ඇවිදීම් හි තත්ත්වයන් හා ඊට අනුරූපව කොවොන්ටම් ඇවිදීම් හි ප්‍රතිෂිත සහසම්බන්ධතා අතර සෘජු සම්බන්ධයක් ඇති බව සොයා ගැණිනි. ප්‍රතිෂිත ඇවිදීමක ද්වි අංශු වලිතය සංඛ්‍යානමය වශයෙන් ස්වායත්ත වන විට, ඊට අනුරූපව ක්වොන්ටම් ඇවිදීම් හි ස්පර්ශෝන්මුඛ වශයෙන් (asymptotically) ප්‍රතිෂිත සහසම්බන්ධතා නොමැත. වෙනත් අය විසින් මෑතකාලීනව පළ කළ ඇතැම් ප්‍රකාශනවල අන්‍යෝන්‍ය නොරතුරු ක්වොන්ටම් ඇවිදීම් හි ප්‍රතිෂිත සහසම්බන්ධතාවන් වශයෙන් යොදාගෙන තිබුණද මෙම විමර්ශනයෙන් ගම්‍ය වූයේ එය නිවැරදී නොවන බවයි.

6.2B.6. පර්යේෂණ ව්‍යාපෘතිය **ස්වාභාවික නිෂ්පාදන**
ව්‍යාපෘති නායක **මහාචාර්ය යූ.එල්.බී. ජයසිංහ**

<u>පර්යේෂණ ව්‍යාපෘතිය හැදින්වීම</u>
මිනිසාට හා ශාක වලට වැළඳෙන රෝග නිවාරණය සඳහා හැකියාවෙන් යුතු ස්වභාවික ඖෂධ ක්‍රියාකාරී සාරයෙන් හා සංයෝග ස්වාභාවික සම්පත් තුළින් හඳුනා ගැනීම ජාතික මූලික අධ්‍යයන ආයතනයේ ස්වභාවික නිෂ්පාදන ව්‍යාපෘතියේ සමස්ත අරමුණ වේ. ස්වභාවික නිෂ්පාදන ව්‍යාපෘතියේ පර්යේෂණ කටයුතු ප්‍රධාන වශයෙන් යොමු වී ඇත්තේ ශ්‍රී ලංකාවේ ඖෂධිය ශාක දිලීර (අන්ත:ශාඛීය දිලීර ඇතුළුව) සහ ආහාරයට යෝග්‍ය පලතුරුවල ද්විතීය පරිවෘත්තක ද්‍රව්‍ය වල රසායනික හා ජීව ක්‍රියාකාරිත්වය හඳුනාගැනීම සඳහාය.

<u>වර්ෂය තුල සිදුකරන ලද ක්‍රියාකාරකම්</u>

- කෘෂිකර්මාන්තය සහ මානව සෞඛ්‍යය සඳහා භාවිත කිරීමට සුදුසු සාරයන් ශාඛ ප්‍රභවයන්ගෙන් සහ ශ්‍රී ලංකාවේ සුලභ දිලීර වලින් ගවේෂණය කිරීම.
- ශාක සහ දිලීර වලින් පිරිසිදු පරිවෘත්තජ හුදකලා කොට හදුනා ගැනීම සහ වෙන් කිරීම.මෙකී පරිවෘත්තජ කෘෂිකර්මාන්තය සහ මානව සෞඛ්‍යය සඳහා සුදුසු බව පෙන්වීම සහ යෙදවීම.
- ක්‍රියාකාරකම්.
    - ඖෂධ ක්‍රියාකාරී සංයෝගවල ශාක ද්විතීයික පරිවෘත්තජ සහ LC-MS අධ්‍යනය
    - ඖෂධ ක්‍රියාකාරී සංයෝගවල රසායනය සහ LC-MS විශ්ලේෂනය
- අපනයන විභවයන් සහිත අඹ විශේෂයක් වන Tom EJC වල පසු අස්වනු රෝග සහ අක්‍රමිකතාවන්හි අහිතකර බලපෑම් අධ්‍යනය සහ ඒවා කළමණාකරනය.

6.2B.7. පර්යේෂණ ව්‍යාපෘතිය **පෝෂණ ජෛව රසායන විද්‍යාව**
ව්‍යාපෘති නායක **ආචාර්ය රුවිනී ලියනගේ**

<u>පර්යේෂණ ව්‍යාපෘතිය හැඳින්වීම</u>
පෝෂණ ජෛව රසායන විද්‍යා අංශයේ මූලික අරමුණ වනුයේ ආහාරවල ක්‍රියාකාරිත්වය හා පෝෂණ ගුණ පිළිබඳවත් ආහාරවල සුරක්ෂිතතාවය හා ගුණාත්මකභාවය පිළිබඳවත් අධ්‍යනය කිරීමයි.

<u>වර්ෂය තුල සිදුකරන ලද ක්‍රියාකාරකම්</u>
ශ්‍රී ලංකාවේ ඇතැම් මුහුදුබඩ පළාත් වලින් එකතු කරන ලද මුහුදු පැළෑටි ඒවායේ පෝෂණ ගුණය පිළිබඳව විශ්ලේෂණය කරන ලද අතර එමගින් අනාවරණය වූයේ ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල දක්නට ලැබෙන මුහුදු පැළෑටි දැඩි ලෙස බැර ලෝහ වලින් දෘෂ්‍ය වී ඇති බවය. මෙකී මුහුදු පැළෑටි පරිභෝජනය සඳහා නුසුදුසු වන හෙයින් එම අධ්‍යනය නවතා දමන ලදී. කෙසේ වුවද මෙකී සොයාගැනීම් පදනම් කරගත් අත්පිටපත ප්‍රකාශයට පත් කිරීම සඳහා සකස් කරමින් පවති. රසායනික ද්‍රව්‍ය හා අනෙකුත් අවශ්‍ය පහසුකම් නොමැති වීම හේතුකොටගෙන ප්‍රති දැල්වීමේ (Anti – inflammatory) ක්‍රියාකාරකම් සහ ACE ප්‍රතිඡේධාත්මක ක්‍රියාකාරකම් උරගා බැලීම සිදුකිරීමට නොහැකි විය.

<u>ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ අධ්‍යයන</u>
ආනයනය කරක ලද පිටිකල කිරිවල ඇති බැර ලෝහ නිෂ්චය කිරීම, සහ දේශීයව නිෂ්පාදනය කල දියර කිරි වලින් සකස් කරන ලද වෙළඳපොලේ පවතින කිරි පිටිවල බැර ලෝහ එකතුවීම යන අධ්‍යනයන් නිම කර ඇති අතර දේශීයව නිෂ්පාදිත දියර කිරිවල බැර ලෝහ එකතු වීමේ අධ්‍යනයන් නිම කිරීමට නියමිතය.

<u>රටෙහි පවතින කාලීන ගැටළු සඳහා වැඩිදියුණු කරන ලද විසඳුම්</u>
ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත් වලින් එකතු කර ගන්නා ලද මුහුදු පැළෑටිවල පෝෂණ ගුණ විමර්ෂණයෙන් එකී පළාත්වල ඇති මුහුදු පැළෑටි දැඩි ලෙස බැර ලෝහ වලින් දෘශ්‍ය වී ඇති බවත් ඒවා සෘජු මනුෂ්‍ය පරිභෝජනය සඳහා නුසුදුසු බවත් සොයාගෙන ඇත.

ශ්‍රී ලංකාවේ රනිල ශාකවල ප්‍රී බයෝටික් ක්‍රියාකාරිත්වය සහ පැසීමේ ගුණාංග ඇගයීම අධ්‍යනය කර ඇති අතර එකී අධ්‍යනයට භාජනය කරන ලද රනිල ශාක අතුරින් කඩලවල අධික ප්‍රී බයෝටික් ක්‍රියාකාරිත්වයක් ඇති බව සොයා ගන්නා ලදී.

6.2B.8. පර්යේෂණ ව්‍යාපෘතිය **ක්ෂුද්‍ර ජීව තාක්ෂණ**
ව්‍යාපෘති නායක **මහාචාර්ය ගාමිණී සෙනවිරත්න**

<u>පර්යේෂණ ව්‍යාපෘතිය හැඳින්වීම</u>
ක්ෂුද්‍ර ජෛව පටල නිෂ්පාදනය සහ වැඩිදියුණු කිරීමත් එකී වැඩිදියුණු කරන ලද ක්ෂුද්‍ර ජෛව පටලවල භූමිකාව කෘෂිකර්මය, වගාවන් සහ පරිසරය ආශ්‍රයෙන් විමර්ශනය කිරීමත් මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කෙරේ.

<u>වර්ෂය තුල සිදුකරන ලද ක්‍රියාකාරකම්</u>
ජෛව පටල පදනම් කරගත් ජෛව පොහොර, ජෛව පටල ජෛව පොහොර (BFBF) ලෙස හඳුන්වනු ලබයි. මේවා කෘෂිකර්මය හා වැවිලි භෝග (විශේෂයෙන් රනිල නොවන උදා: තේ, වී, එළවළු ආදී) සඳහා වැඩි දියුණු කර ඇති අතර ක්ෂේත්‍රයේදී පුළුල් වශයෙන් පරීක්ෂාවට ලක් කර වර්ෂ 2014 දී වෙළඳපොළට හඳුන්වා දී ඇත. මේ වන විට ජෛව පටල ජෛව පොහොර ශ්‍රී ලංකාවෙහි අක්කර 30,000 කට අධික භූමි භාගයක රසායනික පොහොර සමඟ භාවිතයට ගැනෙන අතර රසායනික පොහොර භාවිතය 50%කින් පහත හෙලා ඇත. එමෙන්ම මෙකී පොහොර කාබනික කෘෂිකර්මාන්තයේදී ද භාවිත වේ.

<u>රටෙහි පවතින කාලීන ගැටළු සඳහා වැඩිදියුණු කරන ලද විසඳුම්</u>
වී (Oryza sativa) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාර භෝගය වේ. වැඩවන ඉල්ලුමට මුහුණදීම පිණිස එහි අස්වැන්න වාර්ෂිකව ඉහල නැංවිය යුතුය. කෙසේ වුවද මෙකී ඉලක්ක සපුරා ගත යුත්තේ පරිසර දූෂණය අවම කර ගැනීම පිණිස අවම රසායනික පොහොර ප්‍රමාණයක් භාවිතා කිරීමෙනි. ජෛව පටල ජෛව පොහොර (BFBF) නීතිගත කිරීම රසායනික පොහොර භාවිතය අඩු කිරීම සඳහා වඩාත් සුදුසු ක්‍රියාමාර්ගයන් වන අතර මෙමඟින් කුඹුරු ඉඩම්වල ඵලදායිතාවයද වැඩි කෙරේ. ජෛව පටල ජෛව පොහොර පසෙහි සරු බව සහ ශාක සහ ක්ෂුද්‍ර ජීවී අන්තර්ක්‍රියා වැඩිදියුණු කිරීමද සිදු කරයි.

6.2B.9 පර්යේෂණ ව්‍යාපෘතිය **ජෛව ශක්තිය සහ පාංශු පරිසර පද්ධති**
ව්‍යාපෘති නායක **ආචාර්ය රේණුකා රත්නායක**

<u>පර්යේෂණ ව්‍යාපෘතිය හැඳින්වීම</u>
සෙලියුලේස් නිෂ්පාදනය සහ ඒවායේ යෙදවීම් සඳහා ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර ජීවී ගහනය ගවේශනය කිරීම ජෛව බලශක්ති ව්‍යාපෘතියෙහි ඉලක්කය වේ. ක්ෂුද්‍ර ජීවී සෙලියුලේස් පුළුල් පරාසයක පවතින කර්මාන්ත එනම් ජෛව

ඉන්ධන නිෂ්පාදනය, පල්ප සහ කඩදාසි, රෙදිපිළි ලොන්ඩරි, ආහාර සහ පෙරීම්, කෘෂිකර්මාන්තය ආදී කර්මාන්ත සඳහා භාවිතා කිරීමේ විභවතාවයක් පෙන්වා ඇත. මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වන්නේද සහරෝපනය හෝ ජෛව පටල නිර්මාණය මගින් එන්සයිම නිෂ්පාදනයේ හැකියාවන් වැඩිදියුණු කිරීම පිළිබඳ අධ්‍යනය කිරීමය.

පාංශු පරිසර පද්ධතිය පිළිබඳ ව්‍යාපෘතියෙහි ඉලක්කය වන්නේ පාංශු C හුදකලා (Sequestration) විභවය එහි ගතික ස්වභාවය සහ එය වැඩි දියුණු කිරීමේ ක්‍රමවේදය ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රධාන වෘක්ෂලතා මාදිලි එනම් ස්වාභාවික වනාන්තර සහ වගා කරන ලද වනාන්තර, කෘෂිකාර්මික වගාවන්, ගොවිබිම්, ගෙවතු සහ කුඩා පරිමාණ වගාවන් ආදිය ආශ්‍රයෙන් අධ්‍යනය කිරීමයි.

<u>වර්ෂය තුල සිදු කරන ලද ක්‍රියාකාරකම්</u>

- ශ්‍රී ලංකාවේ නකල්ස් වනාන්තර කලාපයෙහි කාබන් සංචිත ඇගයීම සහ සිතියම්ගත කිරීම
- ශ්‍රී ලංකාවේ කුඹුරු ආශ්‍රිත පසෙහි කාබන් සංචිත ඇගයීම සහ සිතියම්ගත කිරීම
- ශ්‍රී ලංකාවේ වියළි කලාපයෙහි වී පාදක කරගත් විවිධ වගා පද්ධතිවල Arbuscular Mycorrhizal දිලීරවල බහුලතාවය සහ ඒවායේ ආසාදන තත්වයන් අධ්‍යනය කිරීම.
- ජෛව ඉන්ධන නිෂ්පාදනය සහ අනෙකුත් අගය එකතු කරන ලද නිෂ්පාදන සහ ඒවා සැකසුම.
- පදම් කරන ලද සයනොබැක්ටීරියා (cyanobacteria) වන්ට අගය එකතු කිරීම, ශ්‍රී ලංකාවේ මිරිදිය ජලජ පද්ධතිවල වෙසෙන වඩාත් සුලභ වූද cyanobacteria වන්ගේ රූපාත්මක, අනුකමය සහ වර්ගීකරණය හදුනාගැනීම.
- සයනො බැක්ටීරියා (cyanobacteria) රෝපිත එකතුවක් ස්ථාපිත කිරීම.
- යාපනය දිස්ත්‍රික්කයේ ලිං ජලයෙහි නයිට්‍රේට් ඉවත් කිරීම පිණිස Denitrifeling බැක්ටීරියාවන් වෙන්කර ගැනීම සහ එකී බැක්ටීරියාවන් භාවිත කිරීමේ හැකියාව අධ්‍යනය කිරීම.

6.2B.10. පර්යේෂණ ව්‍යාපෘතිය **ස්වභාවික සම්පත් සහ පුනර්ජනනීය බල ශක්ති**
ව්‍යාපෘති නායක **මහාචාර්ය එන්. ඩී. සුභසිංහ**

<u>පර්යේෂණ ව්‍යාපෘතිය හැදින්වීම</u>

ඉහල යන බලශක්ති අවශ්‍යතා සැපිරීම පිණිස නව බලශක්ති විභවයන් සොයා ගැනිම මෙන්ම පවතින සම්පත් වඩා සුදුසු ලෙස උපයෝජනය කිරීම ඉතාමත් වැදගත් වේ. ඉහත අරමුණ පෙරදැරි කරගනිමින් පර්යේෂණ ව්‍යාපෘති කිහිපයක් සැලසුම් කර ඇති අතර මෙකී සංකල්පය බලශක්ති අවශ්‍යතා සැපිරීම සඳහා පමණක් නොවන අතර එය අනෙකුත් භූමි සම්පත් එනම් ඛණිජ සහ භූ තාප සම්පත් අධ්‍යනය සඳහාද ව්‍යාප්ත කර ඇත.

<u>වර්ෂය තුල සිදු කරන ලද ක්‍රියාකාරකම්</u>

- ස්භාවික භූ සම්පත් එනම් භූ තාප සම්පත් ඇගයීම සහ ඛණිජ නිධි ජාතික සංවර්ධනය සඳහා භාවිතා කිරීමේ හැකියාවක් පිළිබඳ ගවේෂණය සහ ඇගයීම.
- ස්වභාවික සහ මිනිසා විසින් නිර්මාණය කරන ලද උපද්‍රව පැහැදිලිව හදුනා ගැනීමේ අදහසින් සම්පත් සහ උපද්‍රව සිතියම් සකස් කිරීම.
- ශ්‍රී ලංකාවේ භූ විද්‍යාව පිළිබඳව සහ භූතල සකස්වීම පිළිබඳ නව දැනුම සහ අවබෝධය වර්ධනය කිරීම.
- බලශක්ති ගැටළු සඳහා තිරසාර සහ පාරිසරික හිතකාමී විසදුම් සෙවීම.
- මානව සම්පත් සංවර්ධනය සහ අදාල විෂය පිළිබඳ මූලික දැනුම වැඩිදියුණු කිරීම.

6.2B.11. පර්යේෂණ ව්‍යාපෘතිය **පරිසර ජීව විද්‍යාව සහ පරිණාමික ජීව විද්‍යාව**
ව්‍යාපෘති නායක **මහාචාර්ය සුරේෂ් පී. බෙන්ජමීන්**

<u>පර්යේෂණ ව්‍යාපෘතිය හැදින්වීම</u>

මාගේ විද්‍යාගාරයේ සිදු කරන පර්යේෂණ භෞමික සහ මිරිදිය පරිසර පද්ධති ආශ්‍රිතව වෙසෙන ශාක සහ සත්ත්ව විශේෂ පිළිබඳව වන අතර ශ්‍රී ලංකාවේ බටහිර ප්‍රදේශයේ ජෛව විවිධත්ව මර්මස්ථාන පිළිබඳවද වැඩි අවධානයක් යොමු කෙරේ. ඒ අතරින් විශේෂයෙන් මූලික අවධානය පර්යේෂණයන්ට භාජනය නොවූ අපෘෂ්ඨවංශීන් සහ කුඩා පැළෑටිවල ජෛව විවිධත්වය කෙරෙහි යොමු කර ඇත. ශ්‍රී ලංකාවේ අපෘෂ්ඨවංශීන් පිළිබඳ සිදුකරන අධ්‍යනයන් ඉතා අල්ප වන අතර බොහෝ පර්යේෂණද යටත් විජිත සමයේ ආරම්භ කරන ලද ඒවාය.

<u>වර්ෂය තුල සිදු කරන ලද ක්‍රියාකාරකම්</u>

- චේතාල මකුළුවන් (Goblin spiders) ගේ අණුක වංශ ප්‍රවේණිය සහ ශ්‍රී ලංකාවේ තෝරාගත් සණ (Araneae : Onopida) සමාලෝචනය.
- ශ්‍රී ලංකාවේ Jumping Spiders (Araneae: Salticidae) ගේ අණුක වංශ ප්‍රවේණිය සහ වර්ගීකරණය.

6.2B.12 පර්යේෂණ ව්‍යාපෘතිය **ශාක සහ පරිසර විද්‍යාව**
ව්‍යාපෘති නායක **මහාචාර්ය එම්.සී.එම්. ඉක්බාල්**

<u>පර්යේෂණ ව්‍යාපෘතිය හැදින්වීම</u>
අපගේ ව්‍යාපෘතියෙහි ප්‍රධානතම ක්ෂේත්‍ර වනුයේ දූෂකකාරක සඳහා ශාක සහ ශාක ජෙව ස්කන්ධ භාවිතයෙන් පාරිසරික ප්‍රතිකර්ම යෙදීම, හායනයට පත්වූ වියළි වනාන්තර ප්‍රතිෂ්ඨාපනය කිරීම, සර්පන්ටයින් පසෙහි වැඩෙන ශාක සහ ඩෙංගු වෛරසය ව්‍යාප්ත වීම හා සබැදි දේශගුණික සහ සමාජ ආර්ථික ක්ෂේත්‍රවල බලපෑම අධ්‍යනය කිරීමය.

<u>වසර තුල සිදු කරන ලද ක්‍රියාකාරකම්</u>

- රෙදි පිළි නිෂ්පාදනය අප ජලයෙන් ඩයි වර්ග ඉවත් කිරීම පිණිස නැවත භාවිත කල හැකි ජෙව අධි පෝෂක සඳහා යොදා ගනු ලබන ශාක ද්‍රව්‍ය පහසුවෙන් ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය නිසා වියෝජනය විය හැකි බැවින් නැවත භාවිත කළ හැකි ජෙව අධිපෝෂක නිෂ්පාදනය කිරීම අභියෝගාත්මක ඉලක්කයකි. විකල්පයක් ලෙස සංයුක්ත (Composite) ද්‍රව්‍ය සඳහා ව්‍යුහයක් ලබා දීම පිණිස අප විසින් (Composite) ද්‍රව්‍ය ඇතුලත් කරන ලද අකාබණික කෙයොලනයිටයක් සංස්ලේෂණය කර ඇත. සංයුක්ත (Composite) නිපදවා ඇත්තේ ඇල්ජිනේට් (ඇනායණික) සහ Chitosam (කැටායණික) භාවිතයෙන් වන අතර මෙය ජීව විද්‍යාත්මක මූලයන්ගෙන් සකසා ගන්නා ලදී.

- **පොස්පේට් සහ නයිට්‍රේට් සඳහා පිළියම්.**
(Composite) සංයුක්තයක් සහ ජලජ ශාකයක් වන සැල්විනියා (Salvenia molesta) යොදා ගනිමින් භාවිතය සඳහා ආදර්ශකයක් සකස් කර ඇත. පොස්පේට් සහිත කෘත්‍රිමව සකසන ලද අපද්‍රව්‍ය සංයෝගයක් සැල්විනියා සහිත බෙසමකට යොදන ලදී. පැය 50ක් තුළදී 86.5% ක පොස්පේට් ප්‍රමාණයක් ඉවත් වී තිබුණි.

- වනාන්තර සායනය හා ප්‍රතිෂ්ඨාපනය.
හුළු වනාන්තර රක්ෂිතය අවට ප්‍රජාවගේ සමාජ ආර්ථික සමීක්ෂණයක්, පාංශු බීජ බැංකු අධ්‍යනය හා වනාන්තර ප්‍රතිෂ්ඨාපනය සඳහා උපක්‍රමද අධ්‍යනය කරන ලදී.

6.2B.13. පර්යේෂණ ව්‍යාපෘතිය **ශාක නාමකරණය හා සංරක්ෂණය**
ව්‍යාපෘති නායක **මහාචාර්ය ඩී.එස්.ඒ. විජේසුන්දර**

<u>පර්යේෂණ ව්‍යාපෘතිය හැදින්වීම සහ වර්ෂය තුල සිදු කරන ලද ක්‍රියාකාරකම්</u>
මෙම ව්‍යාපෘතියෙන් අනාවරණය කරනු ලබන්නේ
(අ) ලංකාවේ ශාකවල වර්ගීකරණය හා ජෙව භූගෝල විද්‍යාත්මක අධ්‍යයන කටයුතු (ආ) ශාක සඳහා ජාතික රතු ලැයිස්තුව සකස් කිරීම (ඇ) ශාක තිරසාර ලෙස භාවිතා කිරීම (ඈ) ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා සංරක්ෂණයට බලපාන ආක්‍රමණශීලි විදේශිය විශේෂ වැනි සාධක අධ්‍යයන කටයුතු සහ (ඉ) ප්‍රතිස්ථාපන පාරිසරික විද්‍යාවයි.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ පවතින 29.7% වන ස්වභාවික වන ආවරණ 32% ක් දක්වා වැඩි කිරීමට රජය සැලසුම් කරමින් සිටියි. හායනයට පත් වූ ප්‍රදේශවල වන ආවරණය ප්‍රතිස්ථාපණය කිරීම සඳහා තෝරාගන්නා ලද වැදගත් ක්‍රමවේදයක් වනුයේ ආධාරක ස්වභාවික ප්‍රතිස්ථාපනය (ANR) ක්‍රමවේදයයි. මෙකී ක්‍රමවේදය (ANR) සඳහා ශ්‍රී ලංකාවේ සුදුසුම ක්ෂේත්‍රය ලෙස සලකනු ලබන්නේ NIFS සෑම් පොපම් රුක් උයනයි. (NIFS - Sam Popham Arboretum) ආධාරක ස්වභාවික ප්‍රතිස්ථාපනය සඳහා සම්මත අඩවියක් ලෙස එහි අර්ථහාරය නිසා බොහෝ වන විද්‍යාඥයින් හා උද්භිද විද්‍යාඥයින් පර්යේෂණ ස්ථානයක් ක්ෂේත්‍රයක් ලෙස මෙම වන උයන භාවිත කරයි. එහි දක්නට ලැබෙන කුරුල්ලන්, උණහපුලුවන් සහ ඇයන් වැනි සුවිශේෂිය සත්වයන් නිසා එය ජනප්‍රිය සංචාරක ගමනාන්තයකි.

ශ්‍රී ලංකාවේ ශාක පිළිබඳ NIFS වෙබ් අඩවිය, විද්‍යා අධ්‍යාපන සහ ව්‍යාප්ති ඒකකය (SEDU) අනුග්‍රහයෙන් යුතුව සකස්කරගෙන යමින් පවති. ඖෂධීය සහ ආක්‍රමණික ශාක වලින් ස්වභාවික නිෂ්පාදන සැකසීම පිළිබඳ පර්යේෂණ ක්‍රියාකාරකම් පේරාදෙණිය සහ ජයවර්ධනපුර යන විශ්ව විද්‍යාල සමග සහයෝගයෙන් යුතුව සිදු කරගෙන යනු ලැබේ.

6.2B.14. පර්යේෂණ ව්‍යාපෘතිය **ප්‍රයිමේට් ජීවවිද්‍යාව**
ව්‍යාපෘති නායක **මහාචාර්ය වොල්ෆ්ගැන්ග් ඩිටස්**

<u>පර්යේෂණ ව්‍යාපෘතිය හැදින්වීම</u>
මෙම පර්යේෂණ ව්‍යාපෘතිය මගින් වඳුරන්ගේ ස්වාභාවික වාසස්ථාන වල නිරීක්ෂණ අධ්‍යනයන් සිදුකරනු ලබයි. අපගේ විද්‍යාගාරය වන පොළොන්නරුව ඓතිහාසික රාජධානිය තුල ඓතිහාසික අධ්‍යනයන් සඳහා පදනම දමා ඇත. අපගේ පර්යේෂණ මාතෘකාවන් ප්‍රධාන ලෙස ආවේනික macaques වඳුරන් පිළිබඳ වන අතර ඊට අමතරව Purple-faced langur (Semnopithecus vetulus), Hamuman langur (S. priam) සහ slender loris (Loris lydekkerianus) වඳුරන් පිළිබඳවද පර්යේෂණ පවත්වනු ලැබේ.

ප්‍රධාන අරමුණු වන්නේ
ප්‍රයිමේටාවන්ගේ සමාජීය හැසිරීම් පිළිබඳ නව දැනුම සැපයීම

1. ප්‍රයිමේටාවන් සහ අනෙකුත් සතුන් කාර්යක්ෂමව සංරක්ෂණය උදෙසා විද්‍යාත්මක පසුබිම සැකසීම
2. විද්‍යාත්මක ප්‍රකාශන සහ වාර්තාමය චිත්‍රපට මගින් දැනුම බෙදා හැරීම
   මෙම වාර්තාමය චිත්‍රපට හුදෙක් දැනුම සහ විනෝස්වාදය උදෙසා පමණක් නොව දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් සංරක්ෂණය උදෙසා අවශ්‍ය සහය ලබාගැනීමටද වැදගත්වේ. අපගේ චිත්‍රපට දේශීය සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමට විශාල සහායක් දක්වයි

ගහන ප්‍රවේණිය. පීතෘත්ව ව්‍යවර්තනය, වසංගත අධ්‍යයනය සහ කායික විද්‍යාව පිළිබඳ වූ අධ්‍යයනයන් කැලෑ වඳුරන්ගේ වර්යාවන්, පරිසරය සහ ජෛව සංඛ්‍යාතය සඳහා අදාළ වන බැවින් මෙකී අධ්‍යයනයන් මගින් විද්‍යාත්මක කටයුතු සඳහා රුකුලක් ලැබුණි. මේ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ දී, පොලොන්නරුව අපගේ අධ්‍යයන භූමිභාගය තුළ, අප විසින් තනි තනි වඳුරන් දහස් ගණනක් හඳුනාගන්නා ලදී. සෑම වඳුරෙකු (Macaque) සඳහාම අප විසින් අදාළ වඳුරාගේ, වර්යාමය වංශ ප්‍රවේණික, පාරිසරික සහ ජන විකාශන ඉතිහාසය සොයා ගනු ලැබූ අතර, නොනැසී ඉතිරිවූවන් සඳහා වර්යාවෙහි විවල්‍යයන් සහ පරිසරය සම්බන්ධ කරන ලදී. මේ සඳහා සංඛ්‍යාන අඛණ්ඩතාවය සහතික කිරීම පිණිස අපට සුවිශාල සාම්පල ප්‍රමාණයක් දීර්ඝ කාලයක් මුළුල්ලේ ලබා ගතයුතු විය. වසර කිහිපයකට පසු අප විසින් මේ හා සමාන තවත් විමර්ශනයක් අලු වඳුරන් සහ purple faced langur සඳහා ද අපගේ පර්යේෂණ භූමිය වන පොලොන්නරුවේ දී ආරම්භ කරන ලදී. උනහපුළුවන් (slender loris) සම්බන්ධයෙන් ද නව අධ්‍යයනයන් යොමු වී ඇත.

<u>පසුගිය වසරේ සිදු කරන ලද ක්‍රියාකාරකම්</u>

- **toque macaque Macaca sinica sinica වන්ගේ ජනවිකාශන අධ්‍යයනය -** toque macaques කණ්ඩායම් 20 කගේ උපත් සහ මරණ වේගය, ආගමන සහ විගමන ආදියෙහි දත්ත මාසිකව ලබාගැනීම. තවද නිර්මාපිත ප්‍රදේශයෙන් කි.මී 3 ට වඩා පිට ගොස් සිටින toque macaques පිළිබඳවද දත්ත එක්රැස් කරන ලදී. ඔවුන් ජීවත්වන නව ප්‍රදේශ ඇතුලත් වනසේ නවතම සිතියම් සකස් කිරීම. පර්යේෂකයන් - සුනිල් ගුණතිලක, වම්ීර පතිරණ, පොළොන්නරුව Association for the Conservation of Primate Diversity (ACPD) හි වරලත් ස්වාභාවවාදීන්.

- **Hanuman langur Semnopithecus priam thersites වන්ගේ ජනවිකාශන අධ්‍යයනය -**hanuman langurs කණ්ඩායම් 11 කගේ උපත් වේගය, ප්‍රජනන චක්‍රය, උපතේදී ලිංග බෙදීම, වයස් සහ ලිංග බෙදීම අතර අනුපාතය, මර්ත්‍යතාවය සහ සමාජ කණ්ඩායම් අතර මාරුවීම ආදී ලක්ෂණ මාසිකව නිරීක්ෂනය කිරීම පර්යේෂකයන් - ජේෂ්ඨ ස්වාභාවවිද්‍යාඥ සුනිල් ගුණතිලක, ACPD.

- **purple-faced langur (PPF)Semnopithecus vetulus philbrickii වන්ගේ ජනවිකාශන අධ්‍යයනය -** PPF langurs න් කණ්ඩායම් 14 කගේ උපත් වේගය, ප්‍රජනන චක්‍රය, උපතේදී ලිංග බෙදීම, වයස් සහ ලිංග බෙදීම අතර අනුපාතය, මර්ත්‍යතාවය සහ සමාජ කණ්ඩායම් අතර මාරුවීම ආදී ලක්ෂණ මාසිකව නිරීක්ෂනය කිරීම
  පර්යේෂකයන් - ජේෂ්ඨ ස්වාභාවවිද්‍යාඥ සුනිල් ගුණතිලක, ACPD.

- **පොළොන්නරුව පරීක්ෂණ ප්‍රදේශය තුල සහ ඒ අවට slender loris Loris lydekkerianus nordicus වන්ගේ නිසාවර හැසිරීම් නිරීක්ෂණය -** අරමුණු වන්නේ සමාජීය ව්‍යුහය අධ්‍යනය, ආහාර රටාව සහ උපත් , මරණ වැනි වැදගත් දත්ත රැස්කිරීම.

- **ලැන්ගුවර් වඳුරන්ගේ ප්‍රවේණි විද්‍යාව, Semnopithecus Vetulus, S.Prian සහ ශ්‍රී ලංකාවේ ඔවුන්ගේ දෙමුහුම් මෙය** NIFS හි ඩට්ස් (Dutts), සුරේෂ් බෙන්ජමින් සහ ඉන්දියාව, බැංග්ලෝරයේ Indian Institute of Scienceහි පාංවන් කරන්ත් අතර අඵතින් ඇනිකරගන්නා ලද සහයෝගිතාවයකි. මෙය ප්‍රයිමේටා විශේෂවල පරිනාමයට අදාල බැවින්, මෙම ගහන අතර ප්‍රවේණි වෙනස්කම් පැහැදිලි කිරීම මෙහි අරමුණ වේ.

- **ප්‍රයිමේට ව්‍යාධි විද්‍යාව**
  පොලොන්නරුවේ toque macaques අතර වෛරස්, බැක්ටීරියා සහ උපදංශ රෝගය වසංගතයක් ලෙස පැතිරීම දැකිය හැකිය. මෙය මහාචාර්ය ජයන්ත රාජපක්ෂ, ආචාර්ය කාවින්ද විජේසුන්දර, සහ ආචාර්ය නීල්හොරදාගොඩ (ජාතික විශ්ව විද්‍යාලය, ඔස්ට්‍රේලියාව) සහ පශු වෛද්‍ය පීඨය , පේරාදෙණිය විශ්ව විද්‍යාලය සමග සහයෝගිතාවයෙන් සිදු කෙරේ.

- සංරක්ෂණ Outreach
  දේශීය සහ විදේශීය සංවිධාන සහ පාර්ශව සඳහා අධ්‍යාපන වැඩසටහන් 7ක් ක්‍රියාත්මක කරන ලදී.

<u>රටෙහි පවතින කාලීන ගැටළු සඳහා වැඩිදියුණු කරන ලද විසඳුම්</u>
පහතරට තෙත් කලාපීය වනාන්තර සහ කඳුකර කලාපයෙහි වෙසෙන අතිශය අවධානම් අනතුරට පත් වූ (IUCN රතු ලේඛනය) ඒක දේශීය වන ජීවීන් සඳහා ස්වාභාවික වාස භූමි සංරක්ෂණය කිරීම සඳහා ගන්නා උත්සාහයන් වැඩි කිරීම, බොහෝ දශක ගණනක් පුරා වෘත්තීමය ජීව විද්‍යාඥයන්ගෙන් ලැබූ උපදේශන සැලසුම් සකස් කරන්නන් සහ ඔවුන්ගේ ක්‍රියාත්මක ආයතන මගින් අඩු තක්සේරුවට ලක් කිරීම.

6.2B.15. පර්යේෂණ ව්‍යාපෘතිය **අණුක ක්ෂුද්‍ර ජීවී විද්‍යාව සහ මානව රෝග**
ව්‍යාපෘති නායක **මහාචාර්ය ධම්මිකා මගනආරච්චි**

<u>පර්යේෂණ ව්‍යාපෘතිය හැදින්වීම</u>
ව්‍යාපෘතියෙහි අරමුණ වනුයේ අණුක සහ විශ්ලේෂණාත්මක මෙවලම් භාවිතයෙන් රෝග ඇතිවීමට හේතුවන ක්‍රමවේදයන් විමර්ශනය කිරීම සහ විශේෂිත රෝග සඳහා අවදානම් සාධක හඳුනාගැනීම වේ.

<u>වර්ෂය තුල සිදු කරන ලද ක්‍රියාකාරකම්</u>
- **ක්ෂය රෝගය සහ වෙනත් පුප්ඵුසීය රෝග.**
  පෙනහළු පිළිකා සහ ක්‍රොන්කයිටිස් රෝගින් තුල පෙනහළු, මයික්‍රෝබියම් (lung microbium) ගේ කාර්යභාරය.
- **එළිමහන් පරිසරයේ සහ ගෘහස්ථ පරිසරවල වෙසෙන වාසර ක්ෂුද්‍රජීවීන් තක්සේරු කිරීම.**
- ශ්‍රී ලංකාවේ මහනුවර වායුගෝලීය අංශුමය ද්‍රව්‍යවල සිටින වායුසර බැක්ටීරියා සහ දිලීර ප්‍රජාව හඳුනාගැනීම සහ වෙන් කිරීම.
- ගෘහාශ්‍රිත පරිසරවල වෙසෙන වායුගෝලීය ක්ෂුද්‍ර ජීවීන්
- **අනුමාන හේතු විද්‍යාවෙහි (Uncertain Aetiology) උග්‍ර වකුගඩු රෝග සඳහා ජෛව සලකුණු කාරක (CKDu)**

<u>රටෙහි පවතින කාලීන ගැටළු සඳහා වැඩිදියුණු කරන ලද විසඳුම්</u>
අපගේ වර්තමාන පර්යේෂණ ව්‍යාපෘතිය වන අනුමාන හේතු විද්‍යාවෙහි උග්‍ර වකුගඩු රෝග සඳහා ජෛව සලකුණුකාරක (CKDU) හි අරමුණ වන්නේ නීරෝගි පුද්ගලයන්ට සාපේක්ෂව විවිධ අවස්ථාවල පසුවන CKDU රෝගින්ගේ රුධිර පිටපත් රටාවන් හඳුනා ගැනීම සහ ජෛව විද්‍යාත්මක ක්‍රමවේදයන්ට අනුකූලව සුවිශේෂී වෙනස්කම් ප්‍රකට කරනු ලබන ජාන (DEGS) හඳුනාගැනීම වේ. නිවරදතාවය 75% සිට 98% සහිතව CKDU සහ .CKD ඇතිකළ හැකි ජාන 6ක මණ්ඩලයක් හඳුනාගැනීමට අපට හැකි වී ඇත.

6.2B.16. පර්යේෂණ ව්‍යාපෘතිය **රයිසෝබියම් ආමුකුලන ව්‍යාපෘතිය සහ නිෂ්පාදනය**
ව්‍යාපෘති නායක **මහාචාර්ය එස්.ඒ. කුලසූරිය**

<u>රයිසෝබියම් ආමුකුලන ව්‍යාපෘතිය සහ නිෂ්පාදනය</u>
- මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වනුයේ රයිසෝබියම් ආමුකුලන වැඩිදියුණු කිරීම සහ ඒවායේ යෙදවීම් ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල සහ බෙහෝ විශේෂවලට අයත් රණිල භෝග සහ ආහාර භෝග වගාවන් සඳහා ව්‍යාප්ත කිරීමය.
- වර්ෂ 2017 දී අප විසින් විශාල වපසරියක එළවළු, බෝංචි සහ මුං ඇට වගාවන් සඳහා ආමුකුලන හඳුන්වා දුන්නෙමු. එසේම අඹේවෙල පශු සම්පත් සීමාසහිත කොම්පැණියෙහි (Abewela Live Stock Company Pvt.Ltd) හි අඹේවෙල ගොවිපල 2017 සිට ඔවුන්ගේ Clover තණ බිම් සඳහා යූරියා යෙදීම වෙනුවට අපගේ ආමුකුලන යෙදීම තීරණය කරන ලදී.
- 2017 වර්ෂයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යල කන්නයේදී ඔවුන්ගේ ජාතික සෝයාබෝංචි ව්‍යාප්ත වැඩසටහන සඳහා අපගේ ආමුකුලන යෙදීමෙන් සුවිශේෂී ප්‍රගතියක් ලබා ගත්හ. හසලක ඇතැම් ස්ථානවල Profuce මූලගැටිති සෑදීම. (ශාකයක මූලගැටිති 100කට අධික ප්‍රමාණයක් හටගැනීම) නිරීක්ෂණය කර තිබුණි.
- වී භෝගය සඳහා ජෛව පොහොරක් ලෙස Azorhizobium Caulinodans (කදෙහි ගැටති සෑදීමේ රයිසෝබියම්) භාවිතය පිළිබඳ ව්‍යාපෘතියෙහි සම අධික්ෂක ලෙස කොළඹ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ශ්‍යාමලි තිරිමාන්න සමග සහයෝගිත්වයෙන් කටයුතු කරන ලදී.

<u>ශ්‍රී ලංකාවේ මිරිදිය වෙසෙන විෂ නිපදවන සයනොබැක්ටීරියාවන්</u>

- ශ්‍රී ලංකාවේ ජලජ පද්ධතිවල වෙසෙන විෂ නිපදවන (Toxigenic) සයනොබැක්ටීරියාවන් සමීක්ෂණය කිරීම සහ ජෛව ඉන්ධන නිෂ්පාදනය සඳහා ඇල්ගී භාවිතා කිරීම පිණිස සහයෝගය දැක්වීම මෙය NIFS හි ආචාර්ය රේනුකා රත්නායක සමග සහයෝගිත්වයෙන් යුතුව සිදුකරනු ලැබේ.
- ශ්‍රී ලංකාවේ තෙත්, අන්තර්, සහ වියළි කළාපවල ව්‍යාප්ත වූ ජලාශ එනම් ජල විදුලිබල නිෂ්පාදන ජලාශ, කෘෂිකර්මය සඳහා යොදාගන්නා ජලාශ , සහ කුඩා වාරි සම්පාදන ජලාශ සහ විනෝදාස්වාදය පිණිස යොදා ගන්නා ජලාශ ආදී ජලාශ 64ක් වියළි හා තෙත් කාල වලදී ආදර්ශ ජල සාම්පල ලබා ගනිමින් සමීක්ෂණයට භාජනය කරන ලදී.
- පරිසර තත්ව අතර , වියළි හා තෙත් කාල වලදී, වියළි හා අතරමැදි කලාපවල ජල පද්ධතිවල PH අගයෙහි සැලකිය යුතු විචලනයක් පෙන්නුම් කළ අතර එවැනි විචලනයන් තෙත් කලාපයේ

නිරීක්ෂණය කළ නොහැකි විය. PH අගය හා දියවූ ඔක්සිජන් අතර ඉතා සුවිශේෂී Pearson's සහසම්බන්ධතාවක් (Pearson's Co-orilation) දක්නට ලැබුණි.

- බොහෝ ජල පද්ධති සුපෝෂණයට තුඩු දී ඇති බව පර්යේෂකයන් පෙන්වා දෙන අතර අධික සයනොබැක්ටීරියාවන් (නීලහරිත ඇල්ගී) ප්‍රමාණයක් අධ්‍යයනයට ලක් කළ බොහෝ ජල පද්ධතිවල පැවතීම මෙයට හේතුව ලෙසද ඔවුන් පැහැදිලි කරයි. විෂ නිපදවන බැක්ටීරියාවන් පිළිබඳ සැලකිමේදී, සාම්පල හදාරන ලද ජල පද්ධතිවල Cylindrospermopsis raciborskii 60% කට වැඩි ප්‍රමාණයක් සිටින බව අධ්‍යයනය මගින් සහතික කරයි. මෙයින් ලංකාව පුරා පවතින ජල පද්ධතිවල මෙකී විෂ නිපදවන බැක්ටීරියාවන්ගේ ඉහල ව්‍යාප්තියක් පෙන්නුම් කරනු ලබයි.

6.2C. සහයෝගිතා සහ උපදේශන අංශය

කළමනාකරණ පාලක මණ්ඩලයේ සභාපති ලෙස ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමාගේ යෝජනාවකට අනුකූලව වර්ෂ 2009 දී ජාතික මූලික අධ්‍යයන ආයතනයෙහි (NIFS) සහයෝගිතා සහ උපදේශන අංශය (CCD) ස්ථාපනය කරන ලදී. බාහිර ආයතන සමඟ සහයෝගීතාව ගොඩනගා ගනිමින් පර්යේෂණ පැවැත්වීමේ ක්‍රමවේදයක් ලෙස සහ NIFS හී විද්‍යාත්මක දැනුම සහ තාක්ෂණය වැඩි වශයෙන් ප්‍රජාව වෙත ලබා දීමේ අරමුණින් මෙය ස්ථාපනය කරන ලදී. සහයෝගිතා සහ උපදේශන අංශය (CCD) හී සභාපති වනුයේ NIFS හී අධ්‍යක්ෂතුමා වන අතර සම්බන්ධීකරණ කටයුතු මහාචාර්ය එස්.ඒ.කුලසූරිය (බාහිර පර්යේෂණ මහාචාර්ය) සමඟ මහාචාර්ය ගාමිණී සෙනෙවිරත්න මහතා සහ ආචාර්ය රේණුකා රත්නායක මහත්මිය විසින් සිදු කරනු ලැබේ.

සහයෝගිතා සහ උපදේශන අංශයෙ හී අරමුණ වනුයේ, බාහිර ආයතන එනම් (පෞද්ගලික අංශය ඇතුළුව) සමඟ සිදුකරනු ලබන NIFS ව්‍යාපෘති සඳහා අනුග්‍රහය දැක්වීමෙන්, නියමානුකූල බවට පත් කිරීමෙන් සහ ප්‍රගති පාලනය කිරීමෙන් සහයෝගීතාවය ලබා දීම සහ ඵලදායී උපදේශනය සඳහා NIFS විද්‍යාඥයන් දිරිගැන්වීමය. සහයෝගීතාවය සහ උපදේශ ලබා ගැනීම සඳහා උනන්දුව දක්වනු ලබන ශ්‍රී ලංකාවේ ලියාපදිංචි පාර්ශව එනම් විශ්ව විද්‍යාල පර්යේෂණ ආයතන රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා මූලික සංවිධාන, සංස්ථාපිත සහ පෞද්ගලික අංශ වැඩි දුර තොරතුරු දැන ගැනීම පිණිස NIFS හී අධ්‍යක්ෂතුමා විමසිය යුතුය.

වර්ෂ 2010 දී **සහයෝගිතා සහ උපදේශන අංශය** මඟින් ආරම්භ කරන ලද ක්‍රියාකාරකම් දෙකක් ඉතාමත් සාර්ථක ලෙස මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඒවා ආදර්ශ ව්‍යාපෘති බවට ද පත්ව ඇත. එමගින් ශ්‍රී ලංකාවේ අඩු වියදම්, පාරිසරික හිතකාමී, තිරසාර කෘෂිකර්මාන්තය සවිබල ගැන්වීම සඳහා අතිශයින්ම ප්‍රයෝජනවත් වූ නිෂ්පාදන රැසක් දායාද කර ඇත. එවානම් ජෛව පටල ජෛව පොහොර ව්‍යාපෘතිය, මෙය Nature's Beauty Creations PLCයටතේ Lanka Bio fertilizers Ltd. සමඟ සහයෝගීතාවයෙන් ක්‍රියාත්මක කරන ලද්දක් වන අතර රයිසෝබියම් ව්‍යාපෘතිය, Pleanty Foods (Pvt), Oasis Marketing(Pvt) සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ සහයෝගීතාවයෙන් යුතුව ක්‍රියාත්මක කරන ලද්දකි. ඉහල පිළිගැනීමක් ලබා ගනිමින් පවතින තවත් ව්‍යාපෘති දෙකක්, එනම් ශ්‍රී ලංකාවේ මීනිරන් නැවත නැවත ආරෝපණය කළ හැකි බැටරි සඳහා වැඩිදියුණු කිරීම ක්‍රියාත්මක වෙමින් පවතින අතර මෙය නැනෝ තාක්ෂණය සහ උසස් ද්‍රව්‍ය ව්‍යාපෘතිය හරහා ආචාර්ය අතුල විජේසිංහ මහතා විසින් සිදුකරගෙන යනු ලැබේ. මෙම ව්‍යාපෘති ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය සහ Sri Lanka Nano Technology ආයතනය සමඟ සහයෝගයෙන් ක්‍රියාත්මක කරනු ලබයි.

6.2D. විද්‍යා අධ්‍යාපන සහ ව්‍යාප්ති ඒකකයේ ප්‍රගතිය

අරමුණ තාක්ෂණික හා විද්‍යාත්මක තොරතුරු විද්වත් ප්‍රජාව අතර හුවමාරුව ප්‍රවර්ධනය සහ ප්‍රජාවගේ විද්‍යාත්මක දැනුම ප්‍රවර්ධනය.

<u>**විද්‍යා විද්වත් ප්‍රජාව සඳහා කතිකාවත්**</u>

- විශේෂණ දේශන NIFS විද්‍යාඥයන් සහ ව්‍යාපෘති සහායකයන් සඳහා දේශීය මෙන්ම විදේශීය කීර්තිමත් විද්‍යාඥයන් සමඟ විද්වත් කතිකා පැවැත්වීම.
- Journal Club Meetings - පර්යේෂණ සහායකයන් දිරිමත් කිරීම සඳහාත්, ඔවුනට පවතින පර්යේෂණමය ගැටළු මෙන්ම ඔවුන්ගේ පර්යේෂණ පිළිබඳ උසස් විද්‍යාඥයන්ගේ අත්දැකීම් බෙදා ගැනීම සඳහාත් මෙවැනි දේශන සංවිධානය කෙරේ.
- අන්තර්ජාතික/ජාතික වැඩමුළු, ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ සහ සමුළු.

මහජනයාගේ විද්‍යා අවබෝධය වැඩිදියුණු කිරීම සඳහා වූ ක්‍රියාකාරකම්

පාසල් ප්‍රජාව තුල විද්‍යා සංස්කෘතිය ගොඩනැංවීම සහ ඔවුන් තුළ විද්‍යාවේ රිද්මය වැඩිදියුණු කිරීම පිණිස වැඩමුළු, විද්‍යා කදවුරු සහ පුහුණු වැඩසටහන් පවත්වන ලදී. ඊට අමතරව SEDU මගින් ඉලෙක්ට්‍රොනික මාධ්‍ය තුලින් මෙන්ම මුද්‍රිත මාධ්‍ය තුලින්ද විද්‍යාව ජනප්‍රිය කරවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. විවිධ සන්නිවේදන මාධ්‍ය හරහා SEDU විද්‍යාව ජනප්‍රිය කිරීම පිණිස සහ NIFS හි පර්යේෂණ නව සොයාගැනීම් ව්‍යාප්ත කිරීම සඳහා නිරතව සිටී Diolog, නිලවෙබ් අඩවි සහ NIFS සහ SEDU හි දිනපතා යාවත්කාලීන කරනු ලබන සමාජ ජාල එනම් මුහුණු පොත, ට්විටර් සහ LinkedIn ආදිය භාවිතා කර පහසුවෙන් විද්‍යා සන්නිවේදනය සිදුකරනු ලබයි. අප විසින් තවදුරටත් තොරතුරු සහ විශේෂාංග ලිපි, පුත්පත් සඳහා සහ ඉලෙක්ට්‍රොනික පුවත්පත් සඳහාද සපයනු ලැබේ. වර්ෂ 2016 දී අප පොදු මහජනතාව වෙත විද්‍යා දැනුම ව්‍යාප්ත කිරීම පිණිස ලිපි 30ක් පමණ පුවත්පත්වල පල කල අතර එක් රූපවාහිනී වැඩසටහනක්, රූපවාහිනී ප්‍රවෘත්ති වැඩසටහන් දෙකක් සහ ගුවන් විදුලි ප්‍රවෘත්ති වැඩසටහන් දෙකක් ලෙස වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) පදනම් කරගත් අංශයෙහි ප්‍රගති සාරාංශය

වර්ගය	අංකය	ඉලක්ක කණ්ඩායම්
වැඩමුළු	**2**	විද්‍යාත්මක ප්‍රජාව
සමුළු (ARR)	**1**	විද්‍යාත්මක ප්‍රජාව
විශේෂ දේශන	**20**	විද්‍යාත්මක ප්‍රජාව
Journal Club	**11**	විද්‍යාත්මක ප්‍රජාව
ප්‍රදර්ශනවලට සහභාගි වීම (දේශීය)	**2**	මහජනතාව
ගුවන්විදුලි/රූපවාහිනී/අනෙකුත් මාධ්‍ය වැඩසටහන්	**3**	මහජනතාව
පුවත් පත් විශේෂාංග	**33**	මහජනතාව
පුහුණු වැඩසටහන්	**3**	පාසැල් ප්‍රජාව

විද්‍යා පණිවිඩ සේවා			
	Twitter ට්විටර් පණිවිඩ	*35,993*	
	Facebook	*155,686*	
	Blog	*9,855*	
	Web page වෙබ් පිටු	*24,591*	
	ප්‍රතිලාභීන්		**226,125**
විද්‍යා යූ ටියුබ් වැනලය			**168,508**
NIFS යූ ටියුබ් වැනලය			**11,011**
විද්‍යා සිසුන් සඳහා ජංගම මෘදුකාංග(App)			**1,313**
Facebook			
	SEDU	53,602	
	NIFS	58,670	
	මුළු ප්‍රතිලාභීන්		**112,272**
සිංහල විද්‍යා වෙබ් අඩවිය - විදුමංපෙත			**11,141**
NIFS වෙබ් පිටුව			**89,162**
e වැඩසටහන්වල මුළු ප්‍රතිලාභීන්			**619,532**

6.2E. පුස්තකාලය

NIFS පුස්තකාලය මහාචාර්ය සිරිල් පොන්නම්පෙරුම, හිතවතුන් හා ආසියානු පදනම විසින් පරිත්‍යාගය කරන ලද ඉතාමත් සුළු ප්‍රමාණයක පොත් සහ ජර්නල එකතුවකින් යුතුව 1985 දී ස්ථාපිත කරන ලදී. එදා සිට අද වන විට එය 6800ක නවීන පොත් එකතුවක් හා ජර්නල 120කට අධික ප්‍රමාණයකින් සමන්විත වන අතර එය ජීව විද්‍යාව ,භෞතික විද්‍යාව සහ ගනික විද්‍යාව මෙන්ම දර්ශන විද්‍යාව හා මූලික පෙළ පොත්වල විද්‍යාවේ ඉතිහාසය, නිබන්ධන සහ සංස්කරණය කරන ලද වෙළුම්වලින්ද යුක්තය.

අරමුණු

- NIFS අපගේ පර්යේෂණ කටයුතු සිදු කිරීම පිණිස ද කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා මෙන්ම වෙනත් උනන්දුවක් දක්වන පාර්ශව සහ පිටස්තර පුද්ගලයන්ගේ යහපත පිණිසද ජාතික මූලික අධ්‍යන ආයතනයේ පර්යේෂණ ප්‍රකාශන ඒකරාශි කිරීම, සොයා ලබා ගැනීම (Retrierity) බෙදා හැරීම.
- තුලනාත්මක හා උචිත තොරතුරු එකතුවක් සකස් කිරීම.
- ජාතික හා ජාත්‍යන්තර සියලු තොරතුරු ලබා දීම.
- ඉගෙනීම සහ පර්යේෂණවල උන්නතිය සඳහා නව තාක්ෂණ ක්‍රම සහ නිරන්තරයෙන් වැඩි දියුණු වන පහසුකම් ඇති කිරීම.
- පුස්තකාලය භාවිතා කරන්නන් සහ කාර්යමණ්ඩලය යන දෙපිරිසම සඳහා පුස්තකාලය වැඩිදියුණු කිරීම සහ පවතින භෞතික පහසුකම් උපරිම තත්වයට ගෙන ඒමට කටයුතු කිරීම.
- ආයතනයෙහි අරමුණු සහ ඉලක්ක ප්‍රවර්ධනය කිරීමට දායකවීම.

පොත්, වාර සඟරා සහ වාර්තා ලබා ගැනීම

පසුගිය වසර තුල පොත් 71ක් අපගේ පුස්තකාල පොත් එකතුවට එක් කරන ලද අතර ඉන් පොත් 59ක් මිලදී ගත් අතර 12ක් තෑගි වශයෙන් ලැබුණි. දේශීය හා විදේශීය ආයතන වලින් තෑගි වශයෙන් මෙන්ම, හුවමාරු පදනම යටතේද වාර සඟරා, පුවත් ලිපි සහ වාර්ෂික වාර්තා විශාල ප්‍රමාණයක් ලැබී ඇත. පුස්තකාලය විසින් අප ආයතනයේ ව්‍යාපෘතිවලට අදාල ජර්නල 14ක් සඳහාද දායකත්වය සපයනු ලැබේ.

පුස්තකාලයේ කාලීන සේවා

- පුනරීක්ෂණය සහ පොත් තාවකාලිකව ලබා දීම.
- ලේඛන භාර දීම.
- සම්පත් බෙදා හදා ගැනීම
- අන්තර් පුස්තකාල ණය පහසුකම්
- යුහුසුළු තොරතුරු සේවා
- යුහුසුළු නව අයිතම ප්‍රාප්ති සේවා
- වෙබ් මූලික ඉලෙක්ට්‍රොනික ජර්නල සහ ලිපි මූලාශ්‍ර යාවත්කාලීන කිරීම.
- විද්‍යාත්මක සාහිත්‍යය යාවත්කාලීන කිරීමේ සේවා (SLNS)

මීට අමතරව අප විසින් යාවත්කාලීන කරන ලද අත්‍යවශ්‍ය තොරතුරු NIFS පරිපාලන කටයුතු සඳහා ලබා දෙනු ලැබේ. (වක්‍ර ලේඛ, e. Code) අන්තර්ජාලය භාවිතා කරනු ලබන යාවත්කාලීන පරිගණක පරිශීලනයට අවස්ථාව ලබා දීම සහ සුපිරික්සීම් (Scanning) පහසුකම්වලටද පුස්තකාල පරිශ්‍රය භාවිතා කිරීමට අවස්ථාව සපයමු.

ආයතනික ප්‍රකාශන සංඛ්‍යාංකකරණය

අප ආයතනයේ ප්‍රකාශන ජාතික විද්‍යා පදනම මගින් සංඛ්‍යාංකකරණය කර ඇත. මෙම ව්‍යාපෘතීන්හි ඉලක්කය වනුයේ ආයතනයික e-repository ස්ථාපිත කිරීම සහ ආයතනයික ප්‍රකාශන සඳහා ඉක්මන් මාර්ග ගත (On-line) ප්‍රවේශයක් ලබා දීමය. මෙහිදී සටහන් 1584ක් ඉලෙක්ට්‍රොනිකව සුපිරික්සා (Scan) සර්වරයවකට (Server) උත්පතනය (Upload) කර ඇත.

6.3 මානව සම්පත්

ජාතික මූලික අධ්‍යයන ආයතනය සතු වටිනාම සම්පත වන්නේ සුදුසුකම් සපිරි මානව සම්පතයි. ආයතනයේ පරිපාලනය විසින් සෑම අංශයක් සඳහාම පුහුණු සහ දක්ෂතා වලින් පරිපූර්ණ සේවකයන් සපයාදීම මගින් ආයතනයේ මෙහෙවර සහ දැක්ම ලගාකරගැනීම සඳහා සුදුසු සහයෝගීතාවයන් සපිරි පරිසරයක් නිර්මාණය කරදීම සඳහා කැපවී කටයුතු කරනු ලබයි.



6.3.1. ජාතික මූලික අධ්‍යයන ආයතනයේ සේවක තොරතුරු

2017 වසරේදී ආයතනයේ මානව සම්පත සේවකයින් 137දෙනෙකුගෙන් යුක්ත වූ අතර

- විද්‍යාඥයින් 23 දෙනෙකු
- පර්යේෂණ සහකරුවන් 45 දෙනෙකු
- තාක්ෂණික නිළධාරීන් 16 දෙනෙකුසහ
- අනෙකුත් කාර්යමණ්ඩලවල 53 දෙනෙකු සේවය කරන ලදි.







6.3.2. නව බදවාගැනීම් සහ අස්වීම්

2017 වසරේදී පහත සඳහන් නව බදවාගැනීම් සිදුකරන ලදි.

1. ඩී.එම්.ඒ.ඩී.ඊ. ලියනගේ මිය - කළමනාකාර සහකාර III ශ්‍රේණිය
2. එච්.එම්.ටී.එල්. සුමනරත්න මිය - කළමනාකාර සහකාර III ශ්‍රේණිය
3. බී.ඒ.වයි.බී. ජයවර්ධන මයා - පර්යේෂණ සහකාර II ශ්‍රේණිය
4. කේ.ඒ.එස්.ඩී. කුරුප්පුආරච්චි මයා - පරිපාලන නිලධාරි

5.	පී.එල්.සී.යූ.එස්.බී. ලේකම්ගේ මයා	-	පර්යේෂණ සහකාර II ශ්‍රේණිය
6.	මහාචාර්ය ජී.ආර්.ඒ. කුමාර	-	පර්යේෂණ මහාචාර්ය
7.	ජී.ටී.ආර්. අබේනායක මිය	-	පර්යේෂණ සහකාර II ශ්‍රේණිය
8.	ඩී.පී.ඩී.එම්. සේනාධීර මයා	-	ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර
9.	එච්.එම්.ඩී.ඒ.එච්. බණ්ඩාර මයා	-	පර්යේෂණ සහකාර II ශ්‍රේණිය
10.	කේ.වී.ජී.එස්. පෙරේරා මයා	-	පර්යේෂණ සහකාර II ශ්‍රේණිය
11.	ඩී.එම්.ආර්.ඊ.ඒ. දිසානායක මයා	-	පර්යේෂණ සහකාර II ශ්‍රේණිය
12.	එෆ්.ඒ. ඩීන් මිය	-	පර්යේෂණ සහකාර II ශ්‍රේණිය
13.	ඩී.ආර්.ටී.එල්. හරිස්චන්ද්‍ර මිය	-	Lapidarist III ශ්‍රේණිය
14.	කේ.ඩී.එම්.එස්.පී.කේ.කේ. කුමාරසිංහ මිය	-	පර්යේෂණ සහකාර I ශ්‍රේණිය
15.	පී.ඒ.ආර්.පී. කුමාර මයා	-	පර්යේෂණ සහකාර II ශ්‍රේණිය
16.	ආර්.එච්.ඩබ්.එම්.අයි.සී. රත්නායක මිය	-	තාක්ෂණ නිලධාරී III ශ්‍රේණිය
17.	එස්.ඩබ්. මීපේගම මිය	-	පර්යේෂණ සහකාර II ශ්‍රේණිය
18.	එම්.ඒ.වයි.එන්. වීරසිංහ මිය	-	පර්යේෂණ සහකාර II ශ්‍රේණිය
19.	එන්. පද්මනාදන් මිය	-	පර්යේෂණ සහකාර II ශ්‍රේණිය
20.	ඩබ්.එම්.අයි.යූ.බී. විජේසිංහ මයා	-	අභ්‍යන්තර විගණන නිලධාරී
21.	ආචාර්ය අයි.පී.එල්. ජයරත්න	-	පර්යේෂණ අධි ශිෂ්‍ය
22.	යූ.බී.ආර්.එස්. උඩපිටිය මයා	-	යාන්ත්‍රික III ශ්‍රේණිය
23.	එන්.බී. සූරියආරච්චි මයා	-	පර්යේෂණ සහකාර II ශ්‍රේණිය

පහත සඳහන් සේවකයින් 2017 වසරේදී ආයතනයේ සේවයෙන් ඉවත්වී ඇත

1.	ඩබ්.ටී. අවන්ති මිය	-	පර්යේෂණ සහකාර II ශ්‍රේණිය
2.	එස්.එම්.පී.ආර්.කේ. කුමාරතිලක මයා	-	පර්යේෂණ සහකාර II ශ්‍රේණිය
3.	ජී.ටී.ආර්. අබේනායක මිය	-	පර්යේෂණ සහකාර II ශ්‍රේණිය
4.	ආචාර්ය එම්. විතානගේ	-	ජ්‍යේෂ්ඨ පර්යේෂණ අධි ශිෂ්‍ය
5.	ඩබ්.පී. ජයසේකර මයා	-	යාන්ත්‍රික විශේෂ ශ්‍රේණිය
6.	එස්. සයන්තුරන් මයා	-	පර්යේෂණ සහකාර I ශ්‍රේණිය
7.	ජී.ඩී. ධර්මසේන මයා	-	විදුලි කාර්මික
8.	ආර්.ඩබ්.කේ. අමරසේකර මිය	-	පර්යේෂණ සහකාර II ශ්‍රේණිය
9.	ඩබ්.එස්.එන්.එෆ්. ජයසූරිය මිය	-	අභ්‍යන්තර විගණන නිලධාරී
10.	එල්.එන්.එම්.ඩී.එස්.කේ. නිශ්ශංකා මිය	-	ගිණුම් නිලධාරි
11.	සී.ඕ. ගුණසේන මිය	-	පර්යේෂණ සහකාර III ශ්‍රේණිය
12.	කේ.එන්.එල්.ඩී. සිල්වා මයා	-	පර්යේෂණ සහකාර II ශ්‍රේණිය
13.	ඩී.එම්.වී.වයි.එස්. බණ්ඩාර මයා	-	පර්යේෂණ සහකාර II ශ්‍රේණිය
14.	පී.සී. විජේපාල මිය	-	පර්යේෂණ සහකාර II ශ්‍රේණිය
15.	ආර්.පී.එස්.කේ.රාජපක්ෂ මිය අවසන්	-	පර්යේෂණ සහකාර II ශ්‍රේණිය - කොන්ත්‍රාත්තුව
16.	ජේ.එම්.කේ.ඩබ්. කුමාරි මිය අවසන්	-	පර්යේෂණ සහකාර II ශ්‍රේණිය - කොන්ත්‍රාත්තුව
17.	එම්.එම්. ක්වාඩර් මයා අවසන්	-	පර්යේෂණ සහකාර I ශ්‍රේණිය - කොන්ත්‍රාත්තුව
18.	ජී.ආර්.එන්. රත්නායක මයා අවසන්	-	පර්යේෂණ සහකාර II ශ්‍රේණිය - කොන්ත්‍රාත්තුව
19.	ඩී.තනබාලසිංහම් මිය අවසන්	-	පර්යේෂණ සහකාර II ශ්‍රේණිය - කොන්ත්‍රාත්තුව
20.	ආචාර්ය එස්.එච්.පී.පී. කරුණාරත්න	-	අධ්‍යක්ෂක / ජාතික මූලික අධ්‍යයන ආයතනය

6.3.3 නිපුනතා සංවර්ධනය/ කුසලතා සංවර්ධනය/පුහුණු වැඩසටහන්

ජාතික මූලික අධ්‍යයන ආයතනය පශ්චාත් උපාධි හදාරන තරුණ විද්‍යාඥයින් උදෙසා පසහුකම් රාශියක් සපිරි පුහුණු මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාකරනු ලබයි. 2016 වසරේදී ආයතනයේ විද්‍යාඥයින් විසින් සිසුන් 84 දෙනෙකු පශ්චාත් උපාධි පර්යේෂණ සඳහා මාර්ගෝපදේශ සපයා ඇති අතර එම සිසුන් අතරින් සිසුන් 11 දෙනෙකු 2016 වසරේදී තම පශ්චාත් උපාධි සම්පූර්ණ කර ඇත (ආචාර්ය උපාධි 5 ක් සහ දර්ශණපති උපාධි 6ක්). මීට අමතරව විද්‍යාපති උපාධි හදාරණ සිසුන් 12 දෙනෙකු සහ මූලික විද්‍යා උපාධි හදාරණ සිසුන් 25 දෙනෙකු ද කම උපාධි 2017 වසරේදී තම පර්යේෂණ ව්‍යාපෘති ජාතික මූලික අධ්‍යයන ආයතනයේදී සම්පූර්ණ කර ඇත.

විද්‍යාඥයින් සහ අනෙකුත් කාර්ය මණ්ඩලයන් හට විවිධ අවස්ථා වලදී නිපුනතා සංවර්ධන සහ පුහුණු වැඩසටහන් වලට සහභාගීවීමට අවස්ථා උදාවී ඇත.

නම	ඒකකය	පුහුණු වැඩසටහනේ නම	ආයතනය/පුහුණුව සපයන්නා	අරමුදල් සපයන ආයතනය	කාල පරාසය
ඉන්දික විජේසිංහ මයා	අභ්‍යන්තර විගණන අංශය	පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කිරීම පිළිබඳ පුහුණුව	ප්‍රාග් සේවා පෞද්ගලික සමාගම	ජාතික මූලික අධ්‍යයන ආයතනය	දින 01
පී.එල්.සී.යූ.එස්.බී. ලේකම්ගේ	ශාක වර්ගීකරණය සහ සංරක්ෂණය	ශ්‍රී ලංකාව සහ ඉන්දියාවේ Family Ebenacea හි විශේෂවල රතු දත්ත ඇගයීම	රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය		2017 අප්‍රේල් 24-28
පී.එල්.සී.යූ.එස්.බී. ලේකම්ගේ	ශාක වර්ගීකරණය සහ සංරක්ෂණය	ජාතික ලයිකන වැඩමුළුව 2017	ජාතික මූලික අධ්‍යයන ආයතනය		2017 අප්‍රේල් 24-26
පී.එල්.සී.යූ.එස්.බී. ලේකම්ගේ	ශාක වර්ගීකරණය සහ සංරක්ෂණය	Bryophytes ගේ අපූර්ව ලෝකය	PGIS සහ උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුව පේරාදෙණිය විශ්ව විද්‍යාලය		2017 ජූනි 23
පී.එල්.සී.යූ.එස්.බී. ලේකම්ගේ	ශාක වර්ගීකරණය සහ සංරක්ෂණය	වංශ ප්‍රවේණික ජෛව භූගෝල විද්‍යා සංධර්භය	රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය		2017 අගෝස්තු 17
පී.එල්.සී.යූ.එස්.බී. ලේකම්ගේ	ශාක වර්ගීකරණය සහ සංරක්ෂණය	ශාකාගාර ක්‍රමවේද	රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය		2017 අගෝස්තු 18
පී.එල්.සී.යූ.එස්.බී. ලේකම්ගේ	ශාක වර්ගීකරණය සහ සංරක්ෂණය	ජෛව විවිධත්වය සම්බන්ධයෙන් පාරිසරික සාධකවල බලපෑම	PGIS පේරාදෙණිය		2017 ඔක්තෝම්බර් 27-28
පී.එල්.සී.යූ.එස්.බී. ලේකම්ගේ	ශාක වර්ගීකරණය සහ සංරක්ෂණය	ජාතික ලයිකන වැඩමුළුව 2017	ජාතික මූලික අධ්‍යයන ආයතනය	**NIFS**	2017 අප්‍රේල් 24-28
මහාචාර්ය ජී.සෙනවිරත්න	ක්ෂුද්‍ර ජෛව තාක්ෂණ විද්‍යාව	Keynote Speech title, Microbial Signaling and Sustanability Agroecosystems කෘෂිකර්මය, පර්සර පද්ධති සහ පරිසරය පිළිබඳ ජාත්‍යන්තර වැඩ මුළුව	State key laboratory for conservation and utilization of subtropical agro-bioresources,collage of forestry,Guangxi Univercity, Nanning,Chaina	collage of forestry, Guangxi Univercity, Nanning, Chaina	2017 ජූනි1 1-2
මහාචාර්ය ජී.සෙනවිරත්න	ක්ෂුද්‍ර ජෛව තාක්ෂණ විද්‍යාව	ශ්‍රී ලංකාවේ ජෛව පොහොර සාර්ථකලෙස වාණිජකරණය කිරීමේ අවස්ථා ජෛව කෘෂි රසායනික ද්‍රව්‍ය සහ ජෛව පොහොර පිළිබඳ ජාතික සංවර්ධනය	ජාත්‍යන්තර ජල කළමණාකරණ ආයතනය, බත්තරමුල්ල.	**NIFS**	2017 නොවැම්බර් 29-30
එම්.ඩී. ජීවා කස්තුරි මිය	අධ්‍යක්ෂ කාර්යාලය	ධාරිතා සංවර්ධන වැඩමුළුව	වෘත්තියවේදී සංවර්ධන කේන්ද්‍රය	**NIFS**	2017 දෙසැම්බර් 7,8,14,15
එන්.පී අතුකෝරල මයා	පරිණාමය, පරිසර විද්‍යාව සහ ජෛව විවිධත්වය	තාක්ෂණ ශිල්පීන් සඳහා වූ නිපුණතා සංවර්ධන වැඩසටහන	University Putra Malaysia, Jalan Upm,43400 Serdang,Selangor, Malaysia	**NIFS**	2017 ඔක්තෝම්බර් 22-28
ඩබ්.එස්.පී.පෙරේරා	ප්‍රතිසම්පාදන හා විද්‍යාගාර ගබඩා	තාක්ෂණ ශිල්පීන් සඳහා වූ නිපුණතා සංවර්ධන වැඩසටහන	University Putra Malaysia,	NIFS	2017 ඔක්තෝම්බර් 22-28
අනුර පතිරණ	ක්ෂුද්‍ර ජෛව තාක්ෂණ විද්‍යාව	තාක්ෂණ ශිල්පීන් සඳහා වූ නිපුණතා සංවර්ධන වැඩසටහන	Universit y Putra Malaysia,	NIFS	2017 ඔක්තෝම්බර් 22-28

6.4 වාර්ෂික අයවැය

ලැබී ඇති අරමුදල්	අරමුදල් ප්‍රභවය	ඉල්ලා සිටින මුදල(රු.මිලියන)	ලැබුනු මුදල(රු.මිලියන)	වියදම්කල මුදල(රු.මිලියන)
පර්යේෂණ ව්‍යාපෘතිය	භාණ්ඩාගාරය	187,997,000.00	187,697,000.00	187,891,000.00
	ජාතික විද්‍යා පදනම	1,931,900.00	1,931,900.00.00	3,240,339.81
	ජාතික මූලික අධ්‍යයන ආයතනය			
	විදේශීය			
	වෙනත්			
	1. වෙළඳ මූලාශ්‍ර	2,951,749.52	2,951,749.52	2,634,610.77
	2. මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය	406,950.00	406,950.00	264,538.39
වැඩසටහන්(ජනප්‍රියකරණය, වැඩමුළුව,සම්මන්ත්‍රණ)	භාණ්ඩාගාරය ජාතික විද්‍යා පදනම ජාතික මූලික අධ්‍යයන ආයතනය විදේශීය	1,148,500.00	1,148,500.00	608,289.00
	වෙනත්			
	3. වෙළඳ මූලාශ්‍ර	1,493,622.00	1,493,622.00	
	4. විද්‍යා අමාත්‍යාංශය	1,900,00.00	1,900,00.00	1,193,269.05
ආයතනය නගා සිටුවීම සඳහා	භාණ්ඩාගාරය	98,757,224.00	68,978,379.00	20,472,000.00



7. ජාතික මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික ගිණුම් වාර්තාව 2017

වර්ෂ **2017** දෙසැම්බර් **31** න් අවසන් වන වර්ෂය සඳහා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. පොදු ගිණුම් කරණ ප්‍රතිපත්ති

1.1. ඓතිහාසික පිරිවැය පදනම් කරගත් ශ්‍රී ලංකා රජය ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුව උපචිත පදනමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. මෙම ගිණුම් මිල උද්ධමනය වීමේ හේතුන් මත වෙනස් කිරීමකට භාජනය කර නොමැත. මෝටර් රථ ප්‍රත්‍යාගණනය කිරීම විශේෂිත ප්‍රත්‍යාගණන කමිටුවක් මගින් සිදු කර ඇත.

1.2. විද්‍යාගාර උපකරණ යන්ත්‍රෝපකරණ, හා මෙවලම්, ශීතකරණ, වායුසමීකරණ, සන්නිවේදන උපකරණ, කාර්යාල සහ විවිධ උපකරණ, ක්‍රීඩා භාණ්ඩ විශේෂිත ප්‍රත්‍යාගණන කමිටුවක් මගින් ප්‍රත්‍යාගණනය කර ඇති අතර මෙම ගණනයන් සඳහා මිල උද්ධමනය වීමේ හේතුන් මගින් බලපෑමක් සිදු වී නොමැත.

1.3. **2011** වර්ෂයට අදාල වන ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනයන්, මූල්‍යය ප්‍රකාශනයේ පෙන්වන ලද ප්‍රත්‍යාගණනයන් ආයතනයේ අරමුදල් ගිණුමට ගලපා ඇත. රථ වාහන වල ප්‍රත්‍යාගණනයන් මහනුවර මෝටර් රථ දෙපාර්තුමේන්තුවේ පරීක්ෂකවරුන් විසින් පවත්නා වෙළඳපොළ මිල ගණන් වලට අනුව **2015.02.16** සහ **2015.02.20** බලාත්මක දිනයන් සඳහා සිදුකර ඇත.

1.4. වර්තමාන ඉදිරිපත් කිරීමට අනුකූල වීම සඳහා පෙර වර්ෂයේ වෙනස් කල යුතු සංඛ්‍යාවන් සහ වාක්‍යයන් නැවත සකස් කර ඇත.

1.5. විදේශ මුදල් හුවමාරු කිරීම

ගණුදෙනු සිදුකළ අවස්ථාවන්වලදී පවතින විනිමය අනුපාතයන්ට අනුව සියළුම විදේශ හුවමාරු ගණුදෙනු සිදු කරනු ලැබේ. අනේවාසික විදේශ මුදල් ගිණුම් වල ශේෂය පරිවර්තනය කිරීම ශේෂ පත්‍ර දිනට පවතින විනිමය අනුපාතයට අදාලව සිදු කර ඇත.

1.6. බදුකරණය

1979 අංක **28** දරණ දේශීය ආදායම් බදු පිළිබඳ සංශෝධිත පනතෙහි අංක **8 (ඒ)(XXXIX)** සහ **42 :**එෆ්.එෆ් පරිශේදයන් යටතේ ආයතනය ශ්‍රී ලංකාවේ ආදායම් බදු වලින් නිදහස්කර ඇත.

2. වත්කම් සහ ඒවායේ තක්සේරු පදනම

2.1. තොග

ඓතිහාසික පිරිවැය පදනම මත තොග ගණනය කිරීම සිදුකර ඇති අතර සියළු නිකුත් කිරීම් ප්‍රථම ලැබීම් **FIFO** පදනම යටතේ සිදු කර ඇත.

2.2. ස්ථාවර වත්කම්

2.2.1. ස්ථාවර වත්කම් වල පිරිවැය වන්නේ මිලදී ගැනීම්, හෝ ඉදිකිරීම් කටයුතු සඳහා දරන පිරිවැය සමඟ සිදු වන අනියම් වියදම් වල එකතුවයි. ස්ථාවර වත්කම් පිරිවැයට වාර්තා කර ඇති අතර සමුච්චිත ක්ෂය දක්වා ඇත්තේ **2.2.2** හි සඳහන් වන ක්ෂය අනුපාත පදනම් කරගෙනය.

2.2.2. වටිනාකම අඩුනොවන ඓතිහාසික වටිනාකමක් දරණ පුස්ථකාල පොත් රු.**1,097,477.65** ක අගයක් දරයි.

2.2.3. ස්ථාවර වත්කම් වල ක්ෂයවීම

ක්ෂය වෙන්කිරීම් ස්ථාවර වත්කම්වල පිරිවැය මත සිදු කර ඇති වත්කමේ පිරිවැය පහත සඳහන් ලෙස ඇස්තමේන්තු ගත ඵලදායි ජීවිතකාල පුරා කපා හැරීමෙනි.

මෝටර් රථ වාහන	**20%**
පුස්තකාල පොත්	**33.33%**
ගොඩනැගිලි	**10%**
විද්‍යාගාර උපකරණ	**10%**
ක්‍රීඩා භාණ්ඩ	**33.33%**
පරිගණක	**25%**
පරිගණක මෘදුකාංග	**25%**
ලීබඩු හා උපාංග	**10%**
සන්නිවේදන	**10%**
වායුසමීකරණ	**10%**

ශීතකරණ	**10%**
යන්ත්‍රෝපකරණ හා ක්‍රියාකරවීම්	**10%**
කාර්යාල හා විවිධ	
කාමරවල ඇඳ ඇතිරිලි	**33.33%**
හැඳි ගෑරප්පු, පිහි හා භෝජනාගාර උපකරණ	**33.33%**
*ආරක්ෂිත උපකරණ	**10%**
කාර්යාල උපකරණ	**20%**
විවිධ වත්කම්	**10%**
පුළුල් කළ හැකි වත්කම්	**10%**

*ආරක්ෂිත උපකරණ **1999** සිට බලපාන පරිදි ක්ෂයවීම් අනුපාතය **33.33%** සිට **10%** දක්වා වෙනස් කර ඇත. ක්ෂය වීමේ ගණනය කර ඇත්තේ ස්ථාවර වත්කම් මිල දී ගත් දිනයේ සිට ඒවා අපහරණය කරන දිනය දක්වා බල පැවැත්වෙන අයුරිනි.

2.2.4. **2017** දෙසැම්බර් **31** වන දිනට ආයතනයේ ස්ථාවර වත්කම්වල සමුච්චිත වෙන්කිරීම් එදිනට තිබිය යුතු අයුරින් නිවැරදි කර ඇත.

2.3. ආයෝජනය

සේවායෝජකයා හා සේවකයා දායකවන ජාතික මූලික අධ්‍යයන ආයතනයේ අර්ථසාධක අරමුදල ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ස්ථාවර ගිණුමක ආයෝජනය කර ඇත.

2.4. ආපදා ණය අරමුදල සඳහා ලැබෙන දායක මුදල් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඉතිරිකිරීමේ ගිණුමක තැන්පත් කරනු ලැබේ.

3. වගකීම් හා වෙන්කිරීම්

3.1. ගිණුම් ප්‍රකාශන දින වන විට දැන සිටි සියළු වගකීම් හා වෙන්කිරීම් ගිණුම් වල වාර්තා කර ඇත.

3.2. විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක **12** දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ, වසර **5** හෝ වැඩි කාලයක් ආයතනයේ අඛණ්ඩව සේවය කළ සේවකයන් සඳහා විශ්‍රාමික පාරිතෝෂික ගෙවීම් වෙනුවෙන් මෙම ගිණුම්වල වෙන් කිරීම් කර ඇත. මෙය විලම්භිත බැර කිරීම් යටතේ ශේෂ පත්‍රයේ සඳහන් කර ඇත.

3.3. මූලික අධ්‍යයන ආයතනයේ අර්ථ සාධක අරමුදල

2017 දෙසැම්බර් **31** දින වන විට සාමාජික අරමුදල ගිණුම් ප්‍රකාශනයේ විශේෂිත අරමුදල් යටතේ පෙන්වා ඇත.

4. ආදායම් ලැබීම්

4.1. රජයේ ආධාර මුදල්

වසර තුළ රජයෙන් ලද පුනරාවර්තන ආධාර හා වියදම් ආදායම් හා ගිණුමේ ගාස්තු ගත කර ඇත. පෙර වර්ෂ වල මුළු ආදායම සහ ප්‍රාග්ධන අරමුදල් වල සමුච්චිත අගය ආයතන අරමුදල ලෙස ශේෂපත්‍රයේ දක්වා ඇත.

4.2. විදේශීය හා අනෙකුත් ආධාර මුදල්

වර්ෂය තුළ ලැබුණු විදේශීය සහ අනෙක් මූල්‍යමය ප්‍රධාන, ආදායම් හා වියදම් ගිණුමට අය කර ඇති අතර, එවැනි ආධාර පිලිගත් මූල්‍ය ප්‍රකාශන වල වර්ෂය තුළ සිදු කරන ලද පිරිවැයට සරිලන පරිදි එවැනි දීමනා පිළියෙල කර ඇත. ශේෂ පත්‍රයේ විශේෂිත අරමුදල් හා ප්‍රදාන යටතේ, වියදම් නොකළ ප්‍රදාන ශේෂ පත්‍රයෙහි පෙන්වා ඇත.

4.3. පර්යේෂණ ආධාර මුදල්

විශේෂිත ප්‍රධාන මුදල් වල වියදම් නොකළ ශේෂයන්, ශේෂ පත්‍රයේ විශේෂිත ආධාර මුදල් යටතේ, පර්යේෂණ ප්‍රදාන ලෙස දක්වා ඇත.

5. අයවැය වෙන්කිරීම්

නැවත සකස්කරන ලද අයවැය ඇස්තමේන්තු, ඇස්තමේන්තු යටතේ දක්වා ඇති අතර පෙර වසරේ ප්‍රාග්ධන අරමුදල් එම වසරේම ප්‍රයෝජනයට ගෙන ඇත.

ගණකාධිකාරිණී

ජාතික මූලික අධ්‍යයන ආයතනය

2017.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

වත්කම්	සටහන	ශ්‍රී ලංකා රු **2017**	(පුනප්‍රකාශනය) ශ්‍රී ලංකා රු **2016**
ජංගම වත්කම්			
අතැති මුදල් සහ බැංකු ශේෂය	1	126,262,803.49	164,994,206.
තැන්පතු ඉදිරියට කළ ගෙවීම් හා අත්තිකාරම්	2	21,606,632.11	53,210,960.
ඉවත්කල ස්ථාවර වත්කම්		24,915,351.37	24,915,352
උත්සව අත්තිකාරම් අරමුදල් ආයෝජනය		300,000.00	300,000
ආපදා ණය අරමුදල් ආයෝජනය		268,147.71	381,235
ස්ථාවර තැන්පතු සඳහා උපචිත පොලිය		6,612,943.60	4,521,733
සේවක ආපදා ණය	3	4,628,889.00	4,317,002
මුදල් අත්තිකාරම් සහ වෙනත් ලැබිය යුතුදෑ	4	147,141.78	764,520
තොග	5	2,371,823.92	2,246,152
		187,113,732.98	**255,651,160**
ජංගම නොවන වත්කම්			
අඵතින් ඉදිවන ගොඩනැගිල්ලේ ප්‍රගතිය	6	2,160,000.00	172,171,885
ඉදිකිරීම් සඳහා වන මූලික වියදම්		602,687.50	-
අර්ධ සාධක අරමුදල් ආයෝජනය	7	89,274,351.60	76,925,669
පුහුණු කිරීමේ ධාරිතාවය		949,197.40	949,197
දේපළ පිරියත සහ උපකරණ	8	561,357,327.08	305,033,217
අනුරූප වාර්ථාව		-	-
ඉඩම් ආකෘතිය			37,500
		654,343,563.58	**555,117,468**
මුළු වත්කම්		**841,457,296.56**	**810,768,628**
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු ගිණුම්	9	6,306,493.90	1,030,291
උපචිත වියදම්	10	2,017,958.12	1,996,126
		8,324,452.02	**3,026,417**
ජංගම නොවන වගකීම්			
විශේෂිත අරමුදල් හා ආධාර	11	117,325,572.97	100,983,184
විලම්භීත බැරකම්	12	28,510,185.50	20,844,045
		145,835,758.47	**121,827,229**
මුළු වගකීම්		**154,160,210.49**	**124,853,646**

මුළු ශුද්ධ වත්කම්		**687,297,086.07**	**685,914,982**
ශුද්ධ වත්කම් හා හිමිකම්			
ප්‍රාග්ධන අරමුදල්- වියදම් කළ	13	659,406,939.06	542,858,696
- වියදම් නොකළ		85,026,600.94	132,596,465
ජනාධිපති අරමුදල - වියදම් කළ		7,078,501.15	7,078,501
වත්කම් ප්‍රත්‍යාගණිත අරමුදල		131,630,743.37	131,630,744
ආයතන අරමුදල		(195,845,698.45)	(128,249,424)
මුළු ශුද්ධ වත්කම් සහ හිමිකම්		**687,297,086.07**	**685,914,982**

	සටහන	ශ්‍රී ලංකා රු	(පුනප්‍රකාශනය)
		2017	ශ්‍රී ලංකා රු
			2016
මෙහෙයුම් ආදායම්			
පුනරාවර්තන ආධාර	14	187,677,000.00	181,000,000
අනෙකුත් ආදායම්;		12,540,762.78	13,884,468
		200,217,762.78	**194,884,468**
වියදම්;			
පුද්ගල වේතන	15	122,432,478.30	122,808,073
ගමනාගමන	16	1,324,541.22	1,252,975
සැපයුම් හා පරිභෝජන ද්‍රව්‍ය;	17	14,011,572.81	15,514,969
නඩත්තු	18	10,242,573.41	7,454,054
ගිවිසුම්ගත සේවා	19	22,067,261.30	19,322,160
ක්ෂයවීම්		75,547,835.67	47,630,244
වෙනත් වියදම්	20	28,551,782.04	23,748,351
මුළු මෙහෙයුම් වියදම්		**274,178,044.75**	**237,730,826**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලත් ඌණතාවය		(73,960,281.97)	(42,846,358)
මූල්‍ය පිරිවැය			
ඉවත්කල ස්ථාවර වත්කම් වලින් ලත් ඌණතාවය			
		-	**(928,438.00)**

වර්ෂයේ ශුද්ධ ඌණතාවය	**(73,960,281.97)**	**(43,774,796)**

ජාතික මූලික අධ්‍යයන ආයතනය,ශ්‍රී ලංකාව

2017.12.31 න් අවසන්වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම් වල වෙනස්වීම පිළබඳ ප්‍රකාශනය

	ප්‍රාග්ධන මුදල් ලැබීම්	ජනාධිපති අරමුදල	ප්‍රත්‍යාගණනය කල අතිරික්තය	ආයතන අරමුදල	මුළු ශුද්ධ වත්කම් සහ හිමිකම්
2016 දෙසැම්බර් **31** ශේෂයන්	675,455,161.00	7,078,501.15	131,630,743.37	(129,291,756.08)	684,872,649.44
පෙර වර්ෂයේ ගැලපීම්				1,042,332.44	1,042,332.44
2016 දෙසැම්බර් **31** දිනට ශේෂය **(**නැවත ප්‍රකාශ**)**	675,455,161.00	7,078,501.15	131,630,743.37	(128,249,423.64)	685,914,981.88
ප්‍රත්‍යාගණන හිගය/අතිරික්තය	-	-	-	-	-
ප්‍රදාන වලින් මිලදීගත් ස්ථාවර වත්කම්	-	-	-	740,605.00	740,605.00
ආයතන අරමුදලට වසර තුල එකතු කිරීම්	-	-	-	5,623,402.16	5,623,402.16
අවශිෂ්ඨ කාල පරිච්ඡේද සඳහා ඌනතාවය	-	-	-	(73,960,281.97)	(73,960,281.97)
ඉවත් කළ ස්ථාවර වත්කම්	-	-	-	-	-
ප්‍රදාන ගැලපීම්		-	-	-	-
රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදානයන් සහ අනෙකුත් මූල්‍ය ප්‍රභවයන්	68,978,379.00	-	-	-	68,978,379.00
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	**744,433,540.00**	**7,078,501.15**	**131,630,743.37**	**(195,845,698.45)**	**687,297,086.07**

ජාතික මූලික අධ්‍යයන ආයතනය

ශ්‍රී ලංකාව

2017.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

		ශ්‍රී ලංකා රු **2017**		ශ්‍රී ලංකා රු **2016**
මෙහෙයුම් ක්‍රියාකාරකම් අනුව මුදල් ප්‍රවාහය				
මූලික ක්‍රියාකාරකම් වලින් ලද ඌනතාවය	පිටුව; 5	(73,960,282)		(43,774,796)
එකතුවීම්/අඩුවීම් -අරමුදලට වූ ශුද්ධ ගැලපීම්	පිටුව; 6	5,623,402		23,474,091
			(68,336,880)	**(20,300,705)**
මුදල් හුවමාරු නොවූ				
ක්ෂයවීම්	පිටුව 19 සටහන 8	75,547,836		47,630,244
පාරිතෝෂික දීමනා වෙන්කිරීම්	පිටුව 28 සටහන20	8,557,091		1,897,958
ඉවත්කල ප්‍රාග්ධන වත්කම් වලින් ලත් ලාභය	පිටුව;25 සටහන14	240,386		928,438
ක්ෂය වෙන්කිරීම සඳහා ගැලපීම්	පිටුව 6	-		1,489,147
වැඩිවීම්/ අඩුවීම් සේවක ආපදා ණය	පිටුව 4 සටහන 3	(311,887)		(39,758)
වැඩිවීම්/ අඩුවීම් තොග	පිටුව 4 සටහන 5	(125,672)		(77,138)
වැඩිවීම්/ අඩුවීම් මුදල් අත්තිකාරම් සහ වෙනත් ලැබිය යුතු දේ	පිටුව 4 සටහන 4	617,378		612,610
වැඩිවීම්/ අඩුවීම් ස්ථාවර තැන්පතු සඳහා උපචිත පොලී ලැබීම්	පිටුව 4	(2,091,211)		(1,326,527)
වැඩිවීම්/ අඩුවීම් තැන්පතු ඉදිරියට කළ ගෙවීම් හා අත්තිකාරම්	පිටුව 4 සටහන 2	31,604,328		(32,975,008)
වැඩිවීම්/ අඩුවීම් ඉදිකිරීම් සඳහා මූලික ගෙවීම්	පිටුව 4	(602,688)		20,000
වැඩිවීම්/ අඩුවීම් ගෙවියයුතු ගිණුම්	පිටුව 4 සටහන 9	5,276,203		(3,629,585)
වැඩිවීම්/ අඩුවීම් උපචිත වියදම්	පිටුව; 4 සටහන 10	21,832		(166,385)
පාරිතෝෂික ගෙවීම්		(644,341)		(964,200)
ගෙවිය යුතු ගිණුම් සඳහා ගැලපීම්		253,610		(127,633)
ස්ථාවර වත්කම් ගැලපීම්		(5,679,175)		(9,941,612)
වැඩිවීම්/ අඩුවීම් model of land		37,500		(1,366,835)
			112,701,192	
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය			44,364,312	**19,562,209**

		ශ්‍රී ලංකා රු **2017**		ශ්‍රී ලංකා රු **2016**
ආයෝජන මගින් ලැබූ මුදල් ප්‍රවාහය				
වැඩිවීම්/අඩුවීම් අලුතින් ඉදිවන ගොඩනැගිල්ලේ ප්‍රගතිය	පිටුව 4 සටහන 6	170,011,885		(29,251,885)
ස්ථාවර වත්කම් මිලදීගැනීම්		(326,192,77)		(76,636,305)
පුහුණුවීමේ ධාරිතාවය	පිටුව 4	-		(67,000)
ස්ථාවර වත්කම් සඳහා ගැලපීම්		-		-
ආයෝජන කිරීම් - අර්ධසාධක අරමුදල	පිටුව 4 සටහන 7	(12,348,683)		(11,582,894)
සේවක ආපදා ණය අරමුදල	පිටුව 4	113,087		(155,836)
			(168,416,481)	
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය			**(124,052,170)**	**(137,256,129)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලට අනුව මුදල් ප්‍රවාහය				
රාජ්‍ය ප්‍රාග්ධන මුදල් ලැබීම්	පිටුව 6	68,978,379		144,999,579
විශේෂිත අරමුදල් සහ ප්‍රදාන	පිටුව 4 සටහන 11	16,342,389		12,134,705
			85,320,768	-
ශුද්ධ වැඩිවීම් / අඩුවීම් මුදල් හා මුදල් වලට සමාන දෑ			(38,731,402)	19,878,155
කාල පරිච්ඡේදය ආරම්භයේ මුදල් සහ මුදල් වලට සමාන දෑ			164,994,206	145,116,051
කාල පරිච්ඡේදය අවසානයේ මුදල් සහ මුදල් වලට සමාන දෑ			**126,262,804**	**164,994,206**

ජාතික මූලික අධ්‍යයන ආයතනය, මහනුවර

2017 වර්ෂයේ අයවැය සහ සැබෑ වියදම අතර සංසන්දනය

වියදම් කාණ්ඩය	අයවැය ඇස්තුමේන්තු	සැබෑ වියදම
පුනරාවර්තන වියදම්	188,100,000.00	191,172,600.74
පෞද්ගලික චේතනයන්	**127,080,000.00**	**130,989,569.30**
වැටුප් සහ වේතන	103,695,000	100,662,967.82
අතිකාල සහ නිවාඩු දීමනා	1,850,000	1,729,883.99
සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය	14,265,000	13,396,340.52
සේවක භාරකාර අරමුදල් දායකත්වය	2,685,000	2,679,268.12
පාරිතෝෂික ගෙවීම්	645,000	8,557,091.00
අනියම් සේවක දීමනා	3,940,000	3,964,017.85
ගමනාගමන වියදම්	**1,320,000**	**1,324,541.00**
දේශීය	295,000	300,890.63
විදේශීය	1,025,000	1,023,650.59
සැපයුම්කරුවන්	**16,545,000**	**10,416,514.22**
ලිප ද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා	495,000	480,991.72
ඉන්ධන	2,685,000	2,608,560.54
රසායනික ද්‍රව්‍ය, වීදුරු භාණ්ඩ සහ පරිභෝජන ද්‍රව්‍ය	13,365,000	7,326,961.96
නඩත්තු වියදම්	**10,505,000**	**10,242,573.41**
වාහන	2,645,000	2,487,138.83
උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර	5,315,000	5,259,034.36
ගොඩනැගිලි සහ ව්‍යුහයන්	2,545,000	2,469,400.22
සේවාවන්	**32,650,000**	**38,199,403**
ප්‍රවාහන	1,870,000	1,863,988.00
තැපැල් සහ සන්නිවේදන	1,880,000	1,305,591.13
විදුලිය සහ ජලය	10,240,000	6,878,876.60
වෙනත්		
ආරක්ෂාව	2,555,000	2,617,734.66
ගෙවතු අලංකරණය සහ සනීපාරක්ෂක සේවා	1,930,000	1,935,930.00
භෝජනාගාර සේවා	300,000	300,000.00
අන්තර්ජාල සේවා	3,330,000	3,302,591,16
මුද්‍රණ සහ පුවත්පත් දැන්වීම්	3,210,000	3,211,397.01
රක්ෂණ - ගොඩනැගිලි, වාහන සහ කාර්යමණ්ඩල	1,795,000	1,434,985.02
සුභසාධන	2,415,000	2,287,854.48
වෘක්ෂ උද්‍යානය සහ තෘණ උද්‍යානය	300,000	300,000.00
විගණන වියදම්	100,000	200,000.00
නීතීඥ ගාස්තු	55,000	51,500.00
ප්‍රකාශන්	-	291.20
සඟරා සහ වාර ප්‍රකාශණ	95,000	523,689.04
අනෙකුත්	1,245 ,000	1,285,844.45
වාර්ශික පර්යේෂණ සමුළුව	300,000	299,000.00
කාමර සහ ශ්‍රවණාගාරය	25,000	22,918.08
දායකත්වයන්, සාමාජිකත්වයන් සහ දායකත්වයන්	885,000	442,665.08
දේශීය ලියාපදිංචි ගාස්තු	120,000	116,672.90

බැංකු ගාස්තු	-	56,246.00
ප්‍රදාන වියදම්	-	9,704,707.78
ප්‍රකාශණ - ප්‍රදාන	-	
කාමර කුලී (ඉපැයීම් මත)	-	56,880.00
ක්ෂද්‍රජීවී ජෛව පොහොර කාර්යභාරය - වැඩමුළුව	-	-
මුළු ප්‍රාග්ධන වියදම්	**99,000,000.00**	**326,952,166.16**
ප්‍රාග්ධන වත්කම් වල පුනුරුප්තාපනය සහ වැඩිදියුණු කිරීම	**10,000,000.00**	**167,808,227.38**
ගොඩනැගිලි ආකෘති	9,500,000.00	166,952,667.38
වාහන	500,000.00	855,560.00
ප්‍රාග්ධන වත්කම් අත්පත්කරගැනීම	**89,000,000.00**	**159,143,938.78**
ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ		
(i) විද්‍යාගාර උපකරණ (අලුත් සහ පරණ විද්‍යාගාර)	3,000,000.00	-
(ii) උපකරණ සහ වෙනත්	7,300,000.00	35,678,861.88
කර්මාන්තශාලා, යන්ත්‍රෝපකරණ සහ උපකරන		
(i) විද්‍යාගාර උපකරන	70,000,000.00	113,596,082.75
(ii) පුස්ථකාල පොත්	1,500,000.00	775,471.41
(iii) මැශින් සහ උපකරණ	100,000.00	6,750.00
ඉඩම් සහ ඉඩම් සංවර්ධනය	5,000,000.00	9,086,772.74
මෘදුකාංග වැඩි දියුණු කිරීම ICT	2,000,000.00	-
පුහුණුවීම් සහ කුසලතා	100,000.00	-
මුළු වියදම	**287,100,000.00**	**518,124,766.90**

8. විගණන කළමණාකරණ කමිටුවෙහි වාර්තාව

ජාතික මූලික අධ්‍යයන ආයතනයෙහි අභ්‍යන්තර පාලන හා මූල්‍ය කටයුතු පරීක්ෂා කිරීම සඳහා ජාතික මූලික අධ්‍යයන ආයතනයෙහි විගණන හා කළමණාකරණ කමිටුව පත් කරනු ලබන්නේ පාලක මණ්ඩලය විසින්, පාලක මණ්ඩලයේ අතුරු කමිටුවක් ලෙසිනි.

2017 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවෙහි සංයුතිය

- ජේ.එම්.යූ.පී.ජයමහ මහතා (සභාපති) භාණ්ඩාගාර නියෝජන,
  අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය

- මහාචාර්ය එන්.ජී.ජේ.ඩයස් (පාලක මණ්ඩල සාමාජික)
  පරිගණක විද්‍යා මහාචාර්ය, සංඛ්‍යාකය සහ පරිගණක විද්‍යා දෙපාර්තමේන්තුව කැළණිය විශ්ව විද්‍යාලය

- මහාචාර්ය ජයන්ත විජේරත්න (පාලක මණ්ඩල සාමාජික)
  ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව, කැළණිය විශ්ව විද්‍යාලය/
  සභාපති / ජාතික විද්‍යා සහ තාක්ෂණ කොමිෂන් සභාව

- මහාචාර්ය සී.පී.දීපාල් ඩබ්.මැතිව් (පාලක මණ්ඩල සාමාජික)
  ජෛව රසායන සහ අනුක ජෛව විද්‍යා දෙපාර්තමේන්තුව, වෛද්‍ය විද්‍යා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය

- ආචාර්ය පී.එස්.බී.වඳුරාගල (ලේකම්, පාලක මණ්ඩලය)
  ලේකම් / කැදවුම්කරු, විගනන හා කළමණාකරණ කමිටුව

රැස්වීම්

- 2017 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය තුල විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් 4ක් පවත්වා ඇත.

- ප්‍රධාන මෙහෙයුම් නිලධාරී තුමාට එනම් ආයතනයෙහි අධ්‍යක්ෂ තුමාට සියළුම විගණන සහ කළමනාකරණ රැස්වීම්වලට ආරාධනා කරන ලදී.

- විෂය ක්ෂේත්‍රය සහ වාර්ෂික විගණන චර්යාව සම්බන්ධයෙන් බාහිර විගණන නිලධාරීන් සමග සාකච්ඡා කිරීම් පවත්වන ලදී.

අභ්‍යන්තර විගණනය සහ අවදානම් කළමනාකරණය

විගණනය මගින් ප්‍රධාන අංශ සහ ආයතනයේ ක්‍රියාකාරකම් ආවරණය කර තිබීම සහතික කිරීම පිණිස කමිටුව විසින් අභ්‍යන්තර විගණන වැඩසටහන සමාලෝචනය කරන ලදී.

ආයතනයෙහි වත්කම් ආරක්ෂා කිරීම සඳහා ආයතනයෙහි අභ්‍යන්තර පාලනය සම්බන්ධව ගන්නා ලද ක්‍රියාමාර්ග නිවැරදි යන්න සහතික කිරීම පිණිස ආයතනයෙහි අභ්‍යන්තර විගණන වාර්තා සහ විගණකාධිපති විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම්, විගණන හා කළමණාකරන කමිටුව විසින් සියුම්ව පරීක්ෂාවට ලක් කර ඒ පිළිබඳ සාකච්ඡා කරන ලද අතර මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදය, මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම මත විශ්වාසය තැබිය හැකි බව තහවුරු විය.

සියලුම විගණන කළමණාකරන රැස්වීම් සඳහා ගණකාධිකාරිවරයාට සහභාගීවීමට ආරාධනය කළ අතර NIFS නි මූල්‍ය මෙහෙයුම් සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් ඉදිරිපත් කරන ලදී. අදාල අංශ ප්‍රධානීන්ගේ ප්‍රතිචාරයන්ට අනුකූලව අභ්‍යන්තර විගණන අනාවරණයන් සමාලෝචනයට ලක් කරන ලද අතර අවශ්‍ය නිවැරදි කිරීම් සහ ක්‍රියාමාර්ග නිර්දේශ කරන ලදී .

අභ්‍යන්තර පාලනය

මෙම රැස්වීම් වලදී කමිටුව විසින් මූල්‍ය අවදානමට නිරාවරණය වීම් පිලිබඳ වැඩි අවධානයක් යොමු කරමින් ආයතනයෙහි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි ප්‍රමාණාත්මක භාවය සහ කාර්යක්ෂමතාව පිළිබඳ සමාලෝචනය කරන ලදී.

මූල්‍ය වාර්තා

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයෙහි ගණකාධිකරණ ප්‍රමිතීන්ට සහ අනෙකුත් මූල්‍ය රෙගුලාසිවලට අනුව ආයතනයෙහි මූල්‍ය වාර්තා සහ වාර්ෂික වාර්තාවෙහි විශ්වසනීයභාවය, ස්ථීරතාවය සහ අනුකූලතාවය සම්බන්ධයෙන් සමාලෝචනය කරන ලද අතර මූල්‍ය වාර්තාව ප්‍රකාශයට පත් කිරීමේ හැකියාව පිළිබඳව කමිටුව විසින් සමාලෝචනය කරන ලදී.

බාහිර විගණකවරු

කමිටුව විසින් විගණන ජනරාල් දෙපාර්තමේන්තුව නිකුත් කරන ලද වාර්ෂික මූල්‍ය වාර්තාව සම්බන්ධයෙන් වූ විගණන වාර්තාව සමාලෝචනයට ලක් කල අතර කළමණාකරනය එයට ප්‍රතිචාර දක්වන ලදී. එසේම ඔවුන්ට විශේෂිතව යොමු කරන ලද කරුණු සඳහාද මැදිහත් විය. බාහිර විගණකවරු විගණනය සිදු කළ අතර ඔවුන් දිගින් දිගටම විශේෂිත කරුණු සම්බන්ධයෙන් කළමනාකරණ කමිටුව දැනුවත් කරන ලදී. රැස්වීම් අතරතුර කමිටුව විගණන අධිකාරී මුනගැසුණු අතර එහිදි නිර්දේශ කරන ලද නිවැරදි ක්‍රියාමාර්ග පිළිබඳව විගණනයෙන් මතුවන ගැටළු පිළිබඳවද සාකච්ඡා කරන ලදී.

නිගමනය

ආයතනයේ පවතින පාලනය කරන ලද පරිසරය ජාතික මූලික අධ්‍යයන ආයතනයෙහි මූල්‍ය වාර්තා කිරීම් පිළිබඳ යුක්ති සහගත සහතිකයක් ලබා දී ඇති බවත් වත්කම් ආරක්ෂාකාරී බවත් රාජ්‍ය නීති රීතිවලට අනුකූල බවත් විගණන ගිණුම් ඕනෑම අවප්‍රකාශයකින් නිදහස් බවත් විගණන හා කළමනාකරණ කමිටුවෙහි අදහස වේ.

9. විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } සීඑල්පී/කේඩී/ජේ/එන්අයිඑෆ්එස්/2018/07 (i)

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 ජූලි 31 දින

අධ්‍යක්ෂ,

ජාතික මූලික අධ්‍යයන ආයතනය.

ජාතික මූලික අධ්‍යයන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ජාතික මූලික අධ්‍යයන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 55 දරන ජාතික මූලික අධ්‍යයන ආයතන පනතේ 36(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර, ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ වෙත 2018 මැයි 01 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික මූලික අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 79 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.75,914,655 ක් වූ ජංගම නොවන වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේතුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

2017 මැයි 02 දින රු.623,358 කට මිලදී ගත් රසායනාගාර උපකරණයක් සඳහා වර්ෂයට අදාළ ක්ෂය ප්‍රමාණය රු.41,500 ක් වුවත්, රු.456,503 ක් ලෙස ගිණුම් තැබීම නිසා රු.415,003 ක් වැඩිපුර ක්ෂය කර තිබුණි.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂය අවසානයට වටිනාකම රු.6,306,493 ක්වූ සැපයුම් හා සේවා සඳහා ගෙවිය යුතු ශේෂ සම්බන්ධයෙන් ශේෂ සනාථ කිරීම් හා වටිනාකම රු.24,915,351 ක්වූ ජංගම වත්කම් යටතේ දක්වා තිබූ රසායනාගාර උපකරණ, මෙවලම් හා ලී බඩු සම්බන්ධයෙන් භෞතික පැවැත්ම තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2013 මාර්තු 18 දින රසායනික ද්‍රව්‍ය ආනයනය සඳහා පෞද්ගලික ආයතනයක් වෙත ගෙවන ලද රු. 55,863 ක් වූ අත්තිකාරම් මුදල ලබා දී වසර 05 කට අධික කාලයක් ගතවී ඇතත්, අදාළ භාණ්ඩ ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම
(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය හා 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය	සියලුම අතිරික්ත මුදල්, මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය මත ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්, කෙටිකාලීන තැන්පතු හෝ වෙනත් ඵලදායී ආයෝජනයක යෙදවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් ආයෝජනය කර තිබුණු රු.6,000,000 ක් සඳහා කළමනාකරණ මණ්ඩල අනුමැතිය පමණක් ලබාගෙන තිබුණි .
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
මුදල් රෙගුලාසි 101	අස්ථානගතවී ඇති ලෙසට හඳුනා ගත් රු.1,212,717 ක් වටිනා කාර්යාලීය සහ රසායනාගාර උපකරණ 71 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඇ) 2009 නොවැම්බර් 13 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 438	2015 වර්ෂයේ දී භාවිතයෙන් ඉවත් කරන ලද රු.4,869,102 ක් වටිනා භාණ්ඩ 324 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඈ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය	මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.857,381,928 ක ස්ථාවර වත්කම්වලට අදාළව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.73,960,282 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.43,774,796 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.30,185,486 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව නඩත්තු හා ගිවිසුම්ගත සේවාවන් සඳහා වියදම රු.5,533,621 කින් හා ක්ෂයවීම් රු. 27,917,592 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වාම ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ රු.83,417,267 ක් වූ ආයතනයේ දායකය 2017 වර්ෂයේදී රු.124,020,032 ක් වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය පරිදි වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර, එම සැලැස්ම වාර්ෂිකව යාවත්කාලීන කර කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගෙන, සෑම වර්ෂයක් ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට පෙර විගණකාධිපති, භාණ්ඩාගාරය, රේඛීය අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව ආයතනය සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, ආයතනයේ සමස්ත අරමුණු ඉටු කර ගැනීමට අදාළව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වුවද, සමාලෝචිත

වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් කර තිබුණේ ආයතනයේ ප්‍රසම්පාදන කටයුතු පමණි.

4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ විද්‍යාත්මක පර්යේෂණ මඟින් නව සොයා ගැනීම් සඳහා පේටන්ට් බලපත්‍ර 4 ක් ලබා ගැනීමට ඉලක්ක කර තිබුණද, අයදුම්කර තිබුණේ එක් බලපත්‍රයක් සඳහා පමණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පර්යේෂණ කටයුතුවල නිරතව සිටින කාර්ය මණ්ඩලයේ විද්‍යාඥයින් 19 දෙනෙකු අතුරින්, විද්‍යාඥයින් 06 දෙනෙකු වෙත වර්ෂය තුළ රු.14,578,967 ක ද්‍රව්‍ය හා උපකරණ සපයා තිබුණද කිසිදු පර්යේෂණ කාර්යයක ප්‍රගතියක් වාර්තා වී නොතිබුණි.

(ඇ) විගණනයට ඉදිරිපත් කළ සමාලෝචිත වර්ෂයේ පර්යේෂණ සමාලෝචන කමිටු රැස්වීම් වාර්තා 10 ට අනුව විද්‍යාඥයන්ගේ පර්යේෂණ ප්‍රගතිය පිළිබඳව සමාලෝචනය සිදු කර නොතිබුණි.

(ඈ) ආයතනය ආරම්භ කර වර්ෂ 30 කට වැඩි කාලයක් ඉක්ම ගොස් තිබුණද, පර්යේෂණ ව්‍යාපෘති ඇගයීම සඳහා පොදුවේ පිළිගත් ක්‍රමවේදයන් හඳුන්වා දී නොතිබුණි. ආයතනයේ 2017 ජූනි 28 දින රැස් වූ පර්යේෂණ කවුන්සිලය මඟින් වාර්ෂික පර්යේෂණ ව්‍යාපෘති ඇගයීමේ ක්‍රියාවලින් නිර්මාණය කිරීම සඳහා තීරණයන් ගෙන තිබුණද, විගණන දිනය වූ 2018 ජනවාරි 16 දින වන විටත් එවැනි ක්‍රමවේදයන් හඳුන්වා දී නොතිබුණි. එසේම පර්යේෂණ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් වෙත අදාළ පර්යේෂණ කාර්යයන් පොදුවේ ලබා දී තිබූ අතර, ඒවා ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට හෝ පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 පෙබරවාරි 16 වන දින රු.2,000,000 කට ප්‍රත්‍යාගණිත කළ කැබ් රථ 02 ක් වසරකට අධික කාලයක් භාවිතයෙන් ඉවත්කර තිබුණි. එය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විදේශ ආයතනවලින් පුස්තකාල පොත්, රසායනාගාර ද්‍රව්‍ය හා වෙනත් උපකරණ මිලදී ගැනීම සඳහා 1998 වර්ෂයට පෙර අවස්ථා 04 කදී ලබා දී තිබූ එකතුව රු.57,918 ක අත්තිකාරම් මුදල අය කර ගැනීමට කටයුතු නොකර, පාලක මණ්ඩලයේ අනුමැතිය මත සමාලෝචිත වර්ෂයේ පොත්වලින් ලියා හැරීමට කටයුතු කර තිබුණි.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

ආයතනයේ භෝජනාගාරය පවත්වාගෙන යාමේ සේවාව ලබාදුන් කොන්ත්‍රාත්කරු සමග ආයතනය විසින් 2017 පෙබරවාරි 08 දින එළඹ තිබූ ගිවිසුමේ අංක 17 දරන වගන්තිය මගින් අදාළ කොන්ත්‍රාත්කරු, ආයතනයට අයත් උපකරණ සඳහා රු.100,000 ක රක්ෂණාවරණයක් ලබා දිය යුතු බවට සඳහන් කර තිබුණද, කොන්ත්‍රාත්කරු විසින් අදාළ රක්ෂණාවරණය ලබා දී නොතිබුණි.

4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ආයතනය සතු අක්කර 34.5 ක භූමි ප්‍රමාණයකින් යුතු දඹුල්ලේ පිහිටි "රුක් උයන" කළමනාකරණය සහ නඩත්තු කටයුතු වසර 20 ක කාලයක් සඳහා පෞද්ගලික සංවිධානයක් වෙත 2005 වර්ෂයේදී පවරා දී තිබුණි. ගිවිසුමට අදාළ කොන්දේසි එම සංවිධානය විසින් උල්ලංඝනය කරන බවට 2017 මැයි 25 වන දින අභ්‍යන්තර විගණනයේදී අනාවරණය වී තිබුණද, විගණිත දිනය වූ 2018 ජනවාරි 26 දින වන විටත් මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග නොගෙන 2017 වර්ෂය තුළ රු.300,000 ක මුදලක් අදාළ සංවිධානය වෙත ගෙවා තිබුණි.

4.5 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ආයතනය වෙත ලැබී තිබුණු රු.68,978,379 ක මුදලින් රු.48,507,290 ක් එනම් ප්‍රතිපාදිත මුදලින් සියයට 70 ක් උපයෝජනය කර නොතිබූ අතර, පසුගිය වර්ෂයට අදාළ ප්‍රතිපාදනවලින් සියයට 26 ක මුදලක්ද උපයෝජනය කර නොතිබුණි.

(ආ) ආයතනයේ සෑම මසකම අවසානයට රු.මිලියන 88 ත් රු.මිලියන 154 ත් අතර මුදල් ශේෂයක් පවත්වා ගෙන ගොස් තිබුණද එම මුදල් ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් හෝ ඵලදායී ආයෝජනයක යෙදවීමට හෝ කටයුතු කර නොතිබුණි.

4.6 හඳුනා ගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 සහ 2016 වර්ෂයන්වලදී ආනයනය කළ එකතු වටිනාකම රු.14,053,353 ක් වූ උපකරණ 03 ක් නියමිත පිරිවිතරයන්ට අනුකූල නොවීම හේතුවෙන් ප්‍රතික්ෂේප කිරීමට සිදුවීමෙන් තීරුබදු හා නිෂ්කාශන ගාස්තු ලෙස ගෙවූ රු.1,628,987 ක මුදලක් ආයතනයට අහිමි වී තිබුණි.

(ආ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක පනත හා 2001 අගෝස්තු 24 දිනැති අංක ප්‍ර/ආයතන/11 දරන කම්කරු කොමසාරිස්ගේ ලිපිය ප්‍රකාරව, අධ්‍යයන දීමනා ජීවන වියදම් දීමනාවක් ලෙස නිර්වචනය නොවන බැවින්, මෙම දීමනාව සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් දායකත්වයට අදාළ කර නොගත යුතුය. එහෙත් එම විධිවිධානයට පටහැනිව 2013 ජනවාරි 08 දිනැති අංක 1000 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ උපදෙස් පරිදි ගෙවන ලද අධ්‍යයන දීමනාව මත පදනම්ව අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් ඉහත අරමුදල්වලට ආයතනයේ දායකත්වය ලෙස රු.2,752,659 ක් වැඩිපුර ගෙවා තිබුණි. ඉකුත් වර්ෂවලදීද මේ පිළිබඳ පෙන්වා දී තිබුණද, එය නිවැරදි කිරීමට කටයුතු නොකර දිගින් දිගටම අරමුදල වෙත ප්‍රේෂණයන් කර තිබුණි.

4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණිත දිනය වූ 2018 ජනවාරි 16 දිනට ආයතනයේ කාර්ය මණ්ඩල තනතුරු 04 ක පුරප්පාඩු 28 ක් පැවතුණි. පර්යේෂණ කටයුතු වෙනුවෙන් පිහිටුවා ඇති මෙම ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලයේ අනුමත සංඛ්‍යාව තුළ නිලධාරීන් සියයට 50 කට ආසන්න ප්‍රමාණයක් පුරප්පාඩු වී ඇති බව නිරීක්ෂණය වූ අතර, එය ආයතනයේ මූලික අරමුණු ළඟා කර ගැනීමට දැඩි බාධාවක්ව පවතින බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) තනතුර සඳහා වසර 03 ක කොන්ත්‍රාත් කාලයක් සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ඩීඑම්එස්/1608 හා 2014 මැයි 29 දිනැති ලිපියෙන් අනුමැතිය ලබා දී තිබුණද, එහි 03 ඡේදය ප්‍රකාරව බඳවා ගැනීමේ පරිපාටි සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

4.8 ආර්ථික නොවූ ගනුදෙනු

සමාලෝචිත වර්ෂය සඳහා භෝජනාගාර සේවාව සැපයීම වෙනුවෙන් එළඹී ගිවිසුමෙහි ආයතනයේ ජලනළ වැද්දුම්කරණයට අදාළ පුද්ගලයකු සැපයිය යුතු බවට හා ඒ සඳහා මාසයකට රු.25,000 ක් ගෙවනු ලබන බවට කොන්දේසියක් ඇතුළත් කර තිබුණි. ඒ අනුව අවශ්‍යතාවය මත සුදුසු සේවා සැපයුම්කරුවෙකු අවම පිරිවැයක් යටතේ ලබා ගැනීමට සැලසුම් කිරීමකින් තොරව රු.300,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවීම් කර තිබුණි.

5. තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක NP/SP/SDG/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළව ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීමට / පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

6.1.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව, ආයතනය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම, අත්පොතෙහි 4.2.1 වගන්තිය මඟින් හඳුන්වා දුන් ආකෘතිය අනුව ප්‍රසම්පාදනයන්ට අදාළ කාල රාමුව ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ රු.25,870,610 ක් වූ ගිවිසුම්ගත සේවාවන් 05 ක් සහ රු.20,308,138 ක් වූ ඉදිකිරීම් ව්‍යාපෘති 05 ක් සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) ආයතනය සඳහා පරිගණක පද්ධතියක් සංවර්ධනය කිරීම වෙනුවෙන් පෞද්ගලික සමාගමක් සමග රු.2,200,000 ක මුදලකට 2016 මාර්තු 28 දින ගිවිසුමකට එළඹී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.7 වගන්තිය ප්‍රකාරව, තොරතුරු පද්ධතීන් ප්‍රසම්පාදනය කිරීමේ දී රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගත් විශේෂ ලංසු කැඳවීමේ ලේඛන භාවිතා කර නොතිබුණි.

(ii) වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස 2016 මාර්තු 28 දින රු. 660,000 ක් ගෙවීම් කර තිබුණද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 වගන්තිය ප්‍රකාරව, අත්තිකාරම් සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණි.

(iii) ගිවිසුම ප්‍රකාරව 2016 දෙසැම්බර් 27 වන විට අදාළ කාර්යය අවසන් කළ යුතු වුවද, 2018 පෙබරවාරි වන විටත් එම කාර්යය අවසන් කර නොතිබුණි. නමුත් ගිවිසුමේ 25 ඡේදය ප්‍රකාරව, ප්‍රමාද ගාස්තු ලෙස අයකළ යුතු රු.220,000 ක මුදලක් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.1 (අ) වගන්තිය ප්‍රකාරව, ආයතනයේ ගිවිසුම්ගත සේවා ප්‍රසම්පාදනයේදී, ලියාපදිංචි තැපෑල මඟින් ලංසු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා නොදීම හේතුවෙන්, සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගීවීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථා ලබා දීම යන අරමුණෙන් බැහැරව කටයුතු කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම මඟින් යෝජිත ව්‍යාපෘති සැලසුම් ප්‍රකාරව ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ව්‍යාපෘති 03ක් මාස 06 සිට මාස 11 දක්වා කාලයක් ප්‍රමාද වී වැඩ ආරම්භ කර තිබුණි. ඒ අනුව පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම තාත්වික නොවන බවත්, එය ඵලදායී පාලන කාරකයක් ලෙස භාවිත කර නොමැති බවත් නිරීක්ෂණය විය.

6.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

ඉදිකිරීම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මඟින් හෝ ඊට අනුකූලව මධ්‍යම පළාත් සභාව මඟින් අනුමත කරන ලද මිල ගණන් පාදක කර ගත යුතු වුවත්, ආයතනය රු.18,306,400 ක ඉදිකිරීම් ඇස්තමේන්තු ඊට අනුකූලව

පිළියෙල කර නොතිබුණි. කෙසේ වුවද ඇස්තමේන්තු මත පදනම්ව ඉංජිනේරුවරයාට රු.619,799 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

6.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම හා වියදම තත්‍ය ආදායම හා වියදම සමග සැසඳීමේදී විෂයයන් 06 ක සියයට 49 සිට සියයට 12,541 ක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර		නිරීක්ෂණ
(අ)	ගිණුම්කරණය	ඇතැම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය නොකිරීම.
(ආ)	සැලැසුම්කරණය	ආයතනයේ අරමුණු ඉටු කරගත හැකිවන පරිදි පර්යේෂණ කටයුතු සැලසුම්කර ක්‍රියාත්මක නොකිරීම.
(ඇ)	තොග පාලනය	සෙමින් චලනය වන තොග සහ නිෂ්ක්‍රීය තොග සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකිරීම.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

10. ජාතික මූලික අධ්‍යයන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) සී වගන්තිය ප්‍රකාර 2018 ජූලි 31 වන දින විගණකාධිපතිතුමා විසින් නිකුත් කරන ලද විගණකාධිපති වාර්තාවේ දක්වා ඇති කරුණු පිළිබඳ පාලක මණ්ඩලය විසින් 2018 දෙසැම්බර් 1 වන දින අනුමත කළ පැහැදිලි කිරීම.

1.2 **මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අර්ථකථන**

2.2.1. **ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති**

සියලු වත්කම් නැවත අගය කිරීමටත් සවිස්තරාත්මක ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කිරීමටත් ක්‍රියාකර ඇත.

2.2.2. **මූල්‍ය ඌනතා**

මෙය 2018 පොත්වල ජනරාල් වව්වර 63 හි ප්‍රතිශෝධනය කර ඇත.

2.2.3. **විගණනය සඳහා සාක්ෂි හිඟය**

රු. 6,306,493 ප්‍රමාණාංක සැපයුම් හා සේවා ශේෂය සඳහා තහවුරුකිරීමක් කැඳවා ඇත.ශේෂය තහවුරු කරමින් පවතී. රු. 24,915,351 ප්‍රමාණයක භෞතික වත්කම් පවතින බව සත්‍යාපනය කිරීමට කමිටුවක් පත් කර ඇත. කමිටු වාර්තාව පදනම්කරගෙන මෙකී වත්කම් වලින් නිදහස් වීමට කටයුතු කරනු ඇත.

2.3. **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයෙන් අවසරයක් අවශ්‍ය වූ බැවින් රේගුව මෙම ඇනවුමෙන් අයිතම දෙකක් නිදහස් නොකරන ලදී. අප මධ්‍යම පරිසර අධිකාරියෙන් අවසරය ලබා ගත්තද තවදුරටත් පැහැදිලි කිරීම් ජාතික අන්තරායකර ඖෂධ අධිකාරියෙන් ලබා ගත යුතු විය. භාණ්ඩ නිදහස් කිරීමේ පමාව නිසා ප්‍රමාද ගාස්තුද ගෙවීමට සිදු වූ නමුත් අවසානයේද එම අයිතම අස්ථාන ගත වී ඇත.

2.4. **නීති රෙගුලාසි හා කළමණාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

(a) අදාල චක්‍රලේඛ වලට අනුව අවශ්‍ය කටයුතු කිරීමට සටහන් කර ඇත.

(b) අදාල අයිතම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(c) 2018 මාර්තු මස 4වන දින භාවිතයට ගත නොහැකි අයිතම වෙන්දේසි කරන ලදී.

(d) භාණ්ඩාගාර චක්‍රලේඛ සහ ස්ථාවර වත්කම් ලේඛනය සඳහා වූ රජයේ ආකෘති පත්‍රයට අනුව ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමට කටයුතු කරනු ඇත.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්යසාධනය**

4.1.1 **සැලසුම්කරණය**

(a) රාජ්‍ය ව්‍යවසායකත්ව චක්‍ර ලේඛයට අනුව පස් අවුරුදු ඒකාබද්ධ සැලැස්ම සකස් කිරීමට කටයුතු කර ඇත. මෙකී ඉලක්කය සපුරා ගැනීම සඳහා විද්‍යා. තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශයේ සහය ලබා ගැනීමට අදහස් කෙරේ. සෑම වර්ෂයක් ආරම්භ වීමට ප්‍රථමව ඒකාබද්ධ සැලසුම යාවත්කාලීන කිරීමට කොමිෂන් සභාව අදහස් කර ඉන් අනතුරුව අදාල බලධාරීන් වෙතින් අවසරය ලබා ගැනීමට නියමිතය.

(b) ප්‍රධාන කාර්ය සාධන දර්ශක ඇතුලත් කිරීමෙන් අනතුරුව 2018 වර්ශයේ සිට ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීමට නියමිතය.

4.1.2 **මෙහෙයුම් සහ සමාලෝචනය**

a) ජාතික මූලික අධ්‍යන ආයතනයේ පාලනය ඉක්මවා ඇති ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලයෙන් පේටන්ට් බලපත්‍රයක් නිකුත් කරන තුරු සිටිය යුතුය.

b) අපගේ කාර්යයන් මූලික පර්යේෂණ වෙතට යොමු වී ඇති නිසා අරමුණු සහ ඉලක්ක වෙත අපගේ ජයග්‍රහණ ඍජුව සම්බන්ධ කිරීමට ඇතැම්විට දුෂ්කරය.

c) පර්යේෂණ සඳහා පහසුකම් සැපයීම, නව උපකරණ ලබා දීම, පර්යේෂණ ප්‍රගතිය අධීක්ෂණය වැනි පර්යේෂණ කටයුතු සඳහා අදාලවන සියලු කරුණු පර්යේෂන කටයුතු සඳහා අදාලවන සියලු කරුණු පර්යේෂණ සහ රැස්වීම් වලදී සාකච්චා කරන ලදී.

d) ආයතනයෙහි අරමුණුවලට අදාලව, ව්‍යාපෘතිවල ප්‍රගතිය ඇගයීම පිණිස පාලක මණ්ඩලය සහ පර්යේෂණ සභාවෙහි අනුමැතිය මත වාර්ෂික පර්යේෂණ සමාලෝචනයක් පවත්වන ලදී. මෙම සමාලෝචනයේදී විද්‍යාඥයන් සහ ව්‍යාපෘති තනි තනිව ඇගයීමට ලක් කරන ලදී.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

a) රු. 1,200,000.00 කට පිලි අගයන ලද අංක 54-1066 දරණ වාහනයෙහි ලියා පදිංචිය අවලංගු කිරීමට කටයුතු කර ඇත. ලියාපදිංචිය අවලංගු කිරීමෙන් අනතුරුව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නම් කරන ලද පාසලක් වෙත එකී වාහනය පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. රු.800,000 කට පිලි අගයන ලද අංක 53-9099 වාහනය ධාවනයෙන් ඉවත් කර නැත. ජාතික මූලික අධ්‍යන ආයතනය සතුව පවතින බොහෝ වාහන පැරණි තත්වයේ පවතින බැවින්ද ඒවා අළුත්වැඩියා කරමින් පවතින බැවින්ද අංක 53-9099 වාහනය භාවිතය සඳහා යොදා ඇත.

b) විදේශිය සැපයුම්කරුවන්ගෙන් මිලදී ගැනීම් සම්බන්ධව ආයතනය සතුව ප්‍රමාණවත් තොරතුරු නොමැති බැවින් 2017.02.05 දින සිට පහත සඳහන් කරනු ලබන අත්තිකාරම් කපා හැරීමට පාලක මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.

විස්තරය	වර්ෂය	රුපියල්
Amersham life Science Ltd	**1997**	**1,546**
Bacheman California	**1995**	**11,874**
Fluka Chemical	**1998**	**34,771**
Wageningen Agriculture University of Netherlands	**1998**	**9,727**
		57,918

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

සටහන් තබා ගන්නා ලදී. හැකි ඉකිමනින් අවශ්‍ය කටයුතු ඉටුකරනු ඇත.

4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

10.1 වගන්තියට ප්‍රකාරව ජාතික මූලික අධ්‍යන ආයතනය සහ රුක් රැකගක්නෝ සංවිධානය අතර ඇතිකරගත් ගිවිසුමට අනුව රු. 15,000.00 ක මුදලක් ඔවුනට මාසිකව ලබා දීමට එකඟ වී ඇත. ඔවුන් විසින් සිදු කරන ලද මෙහෙවර සලකා බැලීමෙන් අනතුරුව වාර්ෂිකව මෙකී ගෙවීම් වැඩි කිරීම සඳහා 10.1 වගන්තිය ප්‍රකාර විධිවිධාන සලසා ඇත. ජාතික මූලික අධ්‍යන ආයතනය මෙම ගෙවීම මීට ප්‍රථමයෙන් වැඩි කිරීමක් සිදුකර නොමැත. රුක් රැකගන්නෝ සංවිධානය විසින් සිදු කරන ලද ඉල්ලීමකට අනුව , සලකා බැලීමෙන් අනතුරුව කළමනාකරණ කමිටුවෙහි නිර්දේශය මත පාලක මණ්ඩලය මෙම ගෙවීම රු.25,000.00 දක්වා වැඩි කිරීමට තීරණය කරන ලදී.

4.5 අරමුදල් ඌන උපයෝජනය

(a) උපරිම ප්‍රතිලාභ අන්කර ගැනීම පිණිස අරමුදල් භාවිතා කිරීමට සටහන් තබා ගන්නා ලදී.

(b) අදාල චක්‍රෙල්ඛ අනුව කටයුතු කිරීමට සටහන් තබා ගන්නා ලදී.

4.6 හදුනාගත් පාඩු

(a) ශ්‍රී ලංකා රේගුවෙන් භාණ්ඩ නිදහස් කර ගැනීම සඳහා මෙම මුදල ගෙවන ලදී. විදේශිය කොම්පැනිය ඔවුනට ලැබුණු මුදල ගෙවන ලද අතර ඔවුන් රේගුව මගින් කරන ලද අය කිරීම ගෙවීම සඳහා වගකිවයුතු නොවේ.

(b) කොමිෂන් සභාවෙහි 2013.01.08 චක්‍ර ලේඛ 1000 මත සහ 2017.03.27 දිනැති අංක DMS / B1/ 62/03/v011 ලිපිය හරහා මුදල් හා සැලසුම් අමාත්‍යාංශයේ කළමණාකරන දෙපාර්තමේන්තුව මගින් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයට ලබා දෙන ලද උපදෙස්වලට අනුකූලව පර්යේෂණ කාර්ය මණ්ඩලයට අධ්‍යාපන දීමනාව ලබා දෙන ලදී.

4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

(a) පර්යේෂණ සහයකවරුන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලදී. ධුර කාලය අවසන් වූ පසුව අවසන් වූ පසුව ඔවුන් ආයතනයෙන් බැහැර වේ. ඉන් අනතුරුව පමණක් එකී පුරප්පාඩු පුරවනු ලැබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස පර්යේෂණ සහායකවරුන් සුළු පිරිසකගේ හිඟයක් පවතී. රජයේ රෙගුලාසිවලට අනුකූලව පුරපුපාඩු පිරවීම සඳහා කටයුතු කරගෙන යනු ලැබේ.

(b) උක්ත සංයෝජ්‍ය අධ්‍යක්ෂක (පර්යේෂණ) තනතුර ආයතනයෙහි සිදු කරනු ලබන පර්යේෂණ කටයුතු සඳහා සුවිශේෂී දායකත්වයක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරන අතරම විදේශීය ප්‍රදානද ආකර්ශනය කර ගත යුතුව ඇත. එබැවින් මෙම තනතුර ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාඥයෙකුගෙන් පිරවිය යුතු අතර ඔහු හෝ ඇය විශ්ව විද්‍යාල මහාචාර්යවරයෙකුට ලැබෙන වැටුපට සමාන වැටුපකින් සමතුල්‍ය කළ යුතුය. එමනිසා නියෝජ්‍ය අධ්‍යක්ෂක (පර්යේෂණ) තනතුර සඳහා වන වැටුප් පරිමාව UAC4 (2006) සිට UAC5 (2006) දක්වා වෙනස් කිරීමට කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. 2017.03.27 දිනැති පිලිතුරු ලිපියට අනුව මෙකී තනතුර සඳහා UAC5ඉල්ලීම ඉටු කළ නොහැකිබව දන්වා ඇත. තවදුරටත් 2011.04.11 දිනැති DMS/E2/62/7/277 ලිපිය අනුව UAC4 වැටුප් පරිමාව භාවිතා කරන ලෙස උපදෙස් ලබා දී ඇත.

අනුමත වැටුප් පරිමාව සම්බන්ධනේ එකගතාවයක් නොමැති වීම මත මෙම කරුණ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග සාකච්චා කිරීම සඳහා කටයුතු කරනු ඇත.

4.8 ආර්ථික නොවන ගනුදෙනු

කොන්ත්‍රාක්කරුවන් විසින් වැඩකටයුතු කරගෙන යනු ලබන අතර අනුමැතිය පාලක මණ්ඩලයෙන් ලබා ගෙන ඇත**.**

5. තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම

අදාල චක්‍ර ලේඛ සහ න්‍යාය පත්‍රයට අනුව 2018 වර්ෂය සඳහා ජාතික මූලික අධ්‍යන ආයතනයෙහි තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඇත.

6. වගවීම සහ යහපාලනය

6.1. ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

6.1.1. ප්‍රසම්පාදනය

(a) සටහන් තබා ගන්නා ලදී. නිවැරදි ක්‍රියාමාර්ග ගනු ඇත.

(b) සටහන් තබා ගන්නා ලදී. නිවැරදි ක්‍රියාමාර්ග ගනු ඇත.

(c)

I. ජාතික මූලික අධ්‍යයන ආයතනයෙහි ඒකාබද්ධ මෘදුකාංග ස්ථාපනය සඳහා 2015 ඔක්තෝම්බර් මස 15 වන දින Daily News පුවත්පතෙහි ප්‍රසම්පාදන කැඳවීමේ දැන්වීමක් පල කරන ලදී. (T.O.R) ප්‍රකාරව තාක්ෂණික කමිටුවක ඇගයීමෙන් අනතුරුව සේවා සැපයුම්කරු තෝරා ගන්නා ලදි.

II. Sarasa Solution සීමාසහිත පෞද්ගලික සමාගමෙන් කාර්ය සාධන ඵල බැඳුම්කරය නොලැබුනද ප්‍රගතිය මේ දක්වා සතුටුදායක තත්වයක පැවතුන බැවින් ඔවුන් ඒකාබද්ධ මෘදුකාංගය සවි කිරීමටද වැඩ කටයුතු කාලසටහනකට අනුව ඉටු කිරීමටද (වර්තමාන ක්‍රියාත්මක කිරීමේ කාලය) එකග වූ අතර ප්‍රගතිය 2018.05.01 දිනට හඳුනාගන්නා ලදී.

III. 2016 දෙසැම්බර් මස 17 දිනට ප්‍රථමයෙන් මෘදුකාංග පද්ධතිය සවි කිරීම සඳහා අවශ්‍ය පරිගණක උපාංග ලබා ගැනීමට අපොහොසත් විය. ව්‍යාපෘතියෙහි සත්‍ය විශය පථය, මූලික ඇස්තමේන්තුගත කාලය තුල හඳුනාගත් ක්ෂේත්‍ර වලට සාපේක්ෂව ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ කාලය වෙන් කිරීමෙහි වෙනසක් පවතින බව සීමාසහිත Sarasa Solution පෞද්ගලික සමාගම විසින් තවදුරටත් හඳුනාගන්නා ලදී. ව්‍යාපෘතියෙහි සමස්ථ විශය පථය ලේඛනගත කිරීමේදී සිදුවූ ප්‍රමාදයන්, මෘදුකාංගය සකස් කිරීම, ව්‍යාපෘති වාර්තා සකස් කිරීම, ක්‍රියාවලිය ලේඛන ගත කිරීම ආදී හේතූන් නිසා ඒකාබද්ධ මෘදුකාංගය සංවර්ධනය කිරීමට ගතවූ කාලය දීර්ඝ කරන ලද බව සීමාසහිත Sarasa Solution පෞද්ගලික සමාගම විසින් දැනුම් දෙනු ලැබූ අතර දෙපාර්ශවයෙන්ම සිදුවූ ප්‍රමාද දෝශ හේතුකරගෙන ගිවිසුමෙහි 25වන වගන්තිය ප්‍රකාරව ප්‍රමාද ගාස්තු පැනවීමට නොහැකි විය. සියලු අඩු ලුහුඩුකම් නිවැරදි කර ගැනීමට එකග වෙමින් 2018 අප්‍රේල් මස 11වන දින දෙපාර්ශවය විසින් සංශෝධිත ගිවිසුමකට එළඹෙන ලදී.

(d) ලංසුව ලියා පදිංචි තැපෑලෙන් කැඳවනු නොලැබුනි. සටහන් තබා ගන්නා ලදී. මින් ඉදිරියට එය නිවැරදි කරනු ඇත.

(e) ප්‍රසම්පාදන සැලැස්මට යෝජිත ව්‍යාපෘතිය ඇතුලත් කිරීමටද ඵලදායි පාලන ක්‍රමවේදයක් ලෙස එය භාවිතා කිරීම සදහාද සටහන් තබා ගන්නා ලදී

6.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා

Engineering Sri Lanka ආයතනයෙන් නිකුත් කරන ලද ඉංජිනේරු උපදේශන ගාස්තු සදහා මාර්ගෝපදේශ ආකෘතිය ප්‍රකාරව ඇස්තමේන්තුවෙන් ප්‍රතිශතයක් ගෙවීමට නියමිතය. එසේම අනෙකුත් ගෙවීම් භාවිතා කිරීමේ අපහසුතා හේතුකොටගෙන වර්තමාන ක්‍රමවේදය ප්‍රතිස්ථාපනය කරන ලදී. ගෙවීම් ක්‍රියාවලිය වඩාත් විනිවිද ආකාරයෙන් සිදු කිරීම පිණිස ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙහි අනුමත ගොඩනැගිලි උප ලේඛන ගාස්තු අනුව ඇස්තමේන්තු සකස් කරන ලෙස ඉංජිනේරුවරයා දැනුවත් කර ඇත.

ඵලදායි පාලන ක්‍රමවේදයන් ලෙස අයවැය භාවිතා කිරීම සදහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කරගන්නා ලදී.

7. පද්ධති සහ පාලනයන්

(a) සටහන් තබා ගන්නා ලදි.

(b) සටහන් තබා ගන්නා ලදි.

(c) සටහන් තබා ගන්නා ලදි.

අධ්‍යක්ෂක / ජාතික මූලික අධ්‍යයන ආයතනය

ප්‍රධාන විධායක නිළධාරී / ප්‍රධාන මූල්‍ය නිලධාරී



ANNUAL REPORT 2017

ජාතික මූලික අධ්‍යයන ආයතනය
හන්තාන පාර
මහනුවර 20000
ශ්‍රී ලංකාව

அடிப்படைக் கற்கைகளுக்கான தேசிய நிறுவகம்
ஹந்தான வீதி
கண்டி 20000
இலங்கை

National Institute of Fundamental Studies
Hantana Road
Kandy 20000
Sri Lanka